මුදල් කොමිෂන් සභාවේ
වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2025

වැය ශීර්ෂය අංක 011

මුදල් කොමිෂන් සභාව
අංක 03, සරණ මාවත, රාජගිරිය

පටුන

අන්තර්ගතය **පිටු අංකය**

පරිච්ඡේදය - 01: ආයතනික පැතිකඩ/විධායක සාරාංශය	01
පරිච්ඡේදය - 02: ප්‍රගතිය සහ අනාගත දැක්ම	09
පරිච්ඡේදය - 03: 2025 දෙසැම්බර් 31 අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය	32
පරිච්ඡේදය - 04: කාර්යසාධන දර්ශක	44
පරිච්ඡේදය - 05: තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) සපුරා ගැනීමේ කාර්යසාධනය	45
පරිච්ඡේදය - 06: මානව සම්පත් පැතිකඩ	48
පරිච්ඡේදය - 07: අනුකූලතා වාර්තාව	51

පරිච්ඡේදය - 01: ආයතනික පැතිකඩ / විධායක සාරාංශය

1.1 හැඳින්වීම

1.1.1 පසුබිම

බලතල විමධ්‍යගත කිරීම මගින් පළාත් සභා ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 1987 වර්ෂයේදී හඳුන්වා දෙනු ලැබූ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154ජ ව්‍යවස්ථාව යටතේ මුදල් කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත. පළාත්වල අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් අරමුදල් ආණ්ඩුවේ වාර්ෂික අයවැයෙන් වෙන් කර දීම සඳහා ආණ්ඩුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමත්, පළාත් සඳහා ආණ්ඩුව විසින් වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන අරමුදල් රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් පළාත් අතර බෙදා දීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මෙන්ම පළාත්වල මුදල් කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් යොමු කරනු ලබන වෙනත් යම් කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමත් මුදල් කොමිෂන් සභාව වෙත පැවරී ඇති මූලික කාර්යභාරය වේ. ඒ අනුව, පළාත්වල සමාජ ආර්ථික දියුණුව සඳහා පළාත් සභා විසින් සිදු කරනු ලබන සේවා සැපයීමට අවශ්‍ය පහසුකම් සලසා දීම සඳහා පළාත් වෙත සාධාරණ ලෙස සම්පත් බෙදා හැරීමේ ක්‍රියාවලිය තුළ මුදල් කොමිෂන් සභාව විසින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

1.1.2 මුදල් කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාව මගින් මුදල් කොමිෂන් සභාව ස්ථාපිත කර ඇති අතර, එහි කාර්යභාරය ද සඳහන් කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (3), (4) සහ (5) අනුව්‍යවස්ථාවන්හි නිශ්චිතව දක්වා ඇති පරිදි, මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය පහත පරිදි වේ.

154ජ (3) අනුව්‍යවස්ථාව: පළාතේ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් අරමුදල්, ආණ්ඩුව විසින් මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ අනුව සහ කොමිෂන් සභාව විමසා වාර්ෂික අයවැය ලේඛනයෙන් වෙන් කර දිය යුත්තේය.

154ජ (4) අනුව්‍යවස්ථාව:

(අ) පළාත් සඳහා ආණ්ඩුව විසින් වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන අරමුදල් පළාත් අතර බෙදා දීමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති; සහ

(ආ) පළාත්වල මුදල් කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවට යොමු කරන ලද වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම කොමිෂන් සභාවේ කාර්යය වන්නේය.

154ජ (5) අනුව්‍යවස්ථාව: රට තුළ ප්‍රාදේශීය සංවර්ධනයක් අත්කර ගැනීමේ අරමුණින් කොමිෂන් සභාව විසින් ඒ ප්‍රතිපත්ති පිළියෙළ කළ යුතු අතර, ඒ අනුව,

(අ) එක් එක් පළාතේ ජන සංඛ්‍යාව;

(ආ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම;

(ඇ) විවිධ පළාත් අතර සමාජ හා ආර්ථික විෂමතා අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාව; සහ

(ඈ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම සහ පළාත් අතර ඉහළම ඒක පුද්ගල ආදායම අතර වෙනස අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාව, සැලකිල්ලට ගත යුත්තේය.

මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ ලැබීමෙන් පසු, ගරු ජනාධිපතිතුමා විසින් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි. අනතුරුව 154 ජ (7) අනුව්‍යවස්ථාව අනුව, ගරු ජනාධිපතිතුමා විසින් එකී නිර්දේශ හා එම නිර්දේශ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ.

1.1.3 මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවේ (1) අනුව්‍යවස්ථාවට අනුව, මුදල් කොමිෂන් සභාව පහත පරිදි සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා;

(ආ) භාණ්ඩාගාරයේ ලේකම්වරයා; සහ

(ඇ) එක් එක් තැනැත්තා මූල්‍ය, නීතිය, පරිපාලනය, ව්‍යාපාර හෝ ශාස්ත්‍රීය යන ක්ෂේත්‍රයක කැපී පෙණුනු හෝ උසස් නිලතල දැරූ හෝ තැනැත්තන් විය යුතු වූ ද ප්‍රධාන ජන වර්ග තුන නියෝජනය කිරීම සඳහා, (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද වෙනත් සාමාජිකයන් තිදෙනෙක්.

ඒ අනුව, මුදල් කොමිෂන් සභාවේ වත්මන් සාමාජිකයන් පහත පරිදි වේ.

i. සුමිත් අබේසිංහ මහතා - සභාපති
ii. ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා - සාමාජික (නිල බලයෙන්) සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති
iii. ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මහතා - සාමාජික (නිල බලයෙන්) සහ භාණ්ඩාගාර ලේකම්
iv. එම්. වාමදේවන් මහතා - සාමාජික
v. ටී. නලීන් ඔෂෙන් මහතා - සාමාජික

1.2 මුදල් කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම
තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සහිත සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක්

මෙහෙවර

රටෙහි තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා පළාත් අවශ්‍යතා තක්සේරු කිරීම හා පළාත් සභාවන්ට අරමුදල් බෙදා වෙන් කිරීම පිළිබඳ මූලධර්ම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

මුදල් කොමිෂන් සභාවේ අරමුණු

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යභාරය සපුරාලීම.

2. පළාත්වල අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් අරමුදල් මහා භාණ්ඩාගාරයෙන් ලබා දීම සඳහා නිර්දේශ කිරීම.

3. තුලිත ප්‍රාදේශීය සංවර්ධනය අරමුණු කර ගනිමින් පළාත් අතර මූල්‍ය සම්පත් සාධාරණ ලෙස බෙදා හැරීම සඳහා වූ නිර්දේශ ඉදිරිපත් කිරීම.

4. වෙන් කර දෙනු ලැබූ අරමුදල් විචක්ෂණශීලීව වැය කරන බව තහවුරු කිරීම සඳහා පළාත් සභා වෙත මාර්ගෝපදේශ යොමු කිරීම.

1.3 මුදල් කොමිෂන් සභාව විසින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන්

ඉහත 1.1.2 පරිදි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (3), (4) සහ (5) අනුව්‍යවස්ථා අනුව, මුදල් කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්යභාරය සපුරාලීමේදී පහත සඳහන් කර්තව්‍යයන් ඉටු කරනු ලැබේ.

i. පළාත්වල වාර්ෂික ප්‍රාග්ධන සහ පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීමේ කාර්යය සඳහා තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පළාත් සභා වෙත මාර්ගෝපදේශ නිකුත් කිරීම.

ii. පළාත්වල ප්‍රාග්ධන සහ පුනරාවර්තන අවශ්‍යතා අධ්‍යයනය කර පළාත් බලධාරීන් සමග සවිස්තරාත්මකව සාකච්ඡා කිරීමෙන් අනතුරුව එකී අවශ්‍යතා තක්සේරු කිරීම.

iii. පළාත්වල අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය ප්‍රමාණවත් අරමුදල් වාර්ෂික අයවැයෙන් වෙන් කර දීම සඳහා රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම

iv. පළාත්වල අවශ්‍යතා සඳහා රජය විසින් ලබා දෙන අරමුදල් පළාත් නවය අතර බෙදා දීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති පිළිබඳව ගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

v. වාර්ෂික අයවැයෙන් වෙන් කර දෙනු ලබන අරමුදල් පළාත් අතර බෙදා දීම සහ පළාත් තුළ විවිධ අංශ සඳහා වෙන් කර දීම.

vi. වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස අරමුදල් භාවිතා කිරීමේ අභිලාශයෙන් යුතුව පළාත් වාර්ෂික සංවර්ධන සැලැසුම් සකස් කිරීමට අදාළව මාර්ගෝපදේශ නිකුත් කිරීම.

vii. අදාළ සියළු පාර්ශ්වයන්ගේ සහභාගීත්වයෙන් පළාත් වාර්ෂික සංවර්ධන සැලැසුම් සමාලෝචනය කිරීම සහ අවශ්‍ය යැයි හැඟෙන සංශෝධනයන්ට යටත්ව එම සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාවය ලබා දීම.

viii. පළාත් සේවක සංඛ්‍යාව කළමනාකරණය සම්බන්ධයෙන් ආණ්ඩුවට නිර්දේශ සැපයීම.

1.4 මුදල් කොමිෂන් සභා කාර්යාලයේ ප්‍රධාන අංශ

මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරී සහ උපකාරක අංශවලින් කොමිෂන් සභා කාර්යාලය ව්‍යුහගත කර ඇත.

- ප්‍රතිපත්ති, අධ්‍යයන සහ වාර්තාකරණ අංශය
- පළාත් සංවර්ධන සැලසුම් අංශය
- පළාත් ආදායම්, පළාත් පුනරාවර්තන අවශ්‍යතා සහ කාර්යමණ්ඩල තක්සේරු අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය

1.4.1 මුදල් කොමිෂන් සභා කාර්යාලයේ අංශවල කාර්යයන්

අ. ප්‍රතිපත්ති, අධ්‍යයන සහ වාර්තාකරණ අංශය

1. ගරු ජනාධිපතිතුමා වෙත මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ සකස් කිරීමේදී කොමිෂන් සභාවට සහාය වීම.
2. පළාත් අතර අරමුදල් බෙදා වෙන්කිරීමට අදාළ ප්‍රතිපත්තිමය ක්‍රමවේදය සකස් කිරීම සඳහා කොමිෂන් සභාවට සහාය වීම.

3. මුදල් කොමිෂන් සභා රැස්වීම් පැවැත්වීමේදී අවශ්‍ය සියලු සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

4. විමධ්‍යගත විෂයයන්ට අදාලව ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් අදාල කටයුතු ඉටු කිරීම.

5. මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

6. අයවැය කාරක සභා අවස්ථා විවාදය සඳහා මුදල් කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව සකස්කොට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

7. අවශ්‍යතාවය අනුව අනෙකුත් කාලීන වාර්තා සකස් කිරීම.

ආ. පළාත් සංවර්ධන සැලසුම් අංශය

1. වාර්ෂික පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා ඉදිරිපත් කිරීම සඳහා පළාත් සභාවලට මාර්ගෝපදේශ නිකුත් කිරීම.

2. මුදල් කොමිෂන් සභා නිර්දේශවලට ඇතුළත් කිරීම සඳහා පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම සහ වාර්ෂික අයවැයෙන් වෙන් කරන ලද අරමුදල් පළාත් අතර බෙදා දීම.

3. එක් එක් පළාතට වෙන් කර දෙනු ලබන ප්‍රාග්ධන අරමුදල් විමධ්‍යගත විෂයයන් අතර බෙදා වෙන් කර දීම.

4. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම.

5. නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ මාර්ගෝපදේශ, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ විශේෂ ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ සහ පාසල් පෝෂණ ආහාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීම.

6. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීම සහ එකී සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාව ලබා දීම.

ඇ. පළාත් ආදායම්, පළාත් පුනරාවර්තන අවශ්‍යතා සහ කාර්යමණ්ඩල තක්සේරු අංශය

1. පළාත් පුනරාවර්තන අවශ්‍යතා ඉදිරිපත් කිරීම සඳහා පළාත් සභාවලට මාර්ගෝපදේශ නිකුත් කිරීම.

2. එක් එක් පළාත් සභා, පළාත් පාලන ආයතන සහ පළාත් ව්‍යවස්ථාපිත ආයතනවල පුනරාවර්තන අරමුදල් අවශ්‍යතා තක්සේරු කිරීම සහ ඒ සඳහා රජය මගින් වෙන් කරනු ලබන ප්‍රදාන පළාත් අතර බෙදා දීම.

3. පළාත් ආදායම් තක්සේරු කිරීම සහ ආදායම් ඉලක්ක සැකසීම.

4. පළාත් අවශ්‍යතා අනුව මහා භාණ්ඩාගාරය වෙත අමතර ප්‍රතිපාදන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.

5. පළාත් අවශ්‍යතා සඳහා අක්මුදල් නිදහස් කිරීමේදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.

6. පළාත් කාර්ය මණ්ඩල තීරණය කිරීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.

ඇ. පාලන අංශය

1. මුදල් කොමිෂන් සභාවේ සියලුම නිලධාරීන්ගේ පුද්ගලික ලිපිගොනු කටයුතු - වැටුප් වර්ධක නිර්දේශ කිරීම සහ අනුමත කිරීම, කාර්යසාධන තක්සේරු කිරීම්, අදාල නිලධාරීන්ගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා ගැනීම, වැන්දඹු හා අනත්දරු අරමුදල් කටයුතු, විශ්‍රාම වැටුප් කටයුතු සහ මරණ පාරිතෝෂික කටයුතු, උසස්වීම් හා මාරුවීම් කටයුතු.

2. නිවාඩු සම්බන්ධ කටයුතු - නිලධාරීන්ගේ සහ මුදල් කොමිෂන් සභා සාමාජිකයින්ගේ දේශීය සහ විදේශීය නිවාඩු කටයුතු, වැටුප් සහිත හෝ රහිත අධ්‍යයන නිවාඩු කටයුතු, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ අනෙකුත් රජයේ චක්‍රලේඛවලට අනුව අනෙකුත් අදාළ නිවාඩු කරුණු.

3. කාර්යාලයේ අදාළ නඩත්තු කටයුතු - ජලය, විදුලිය, දුරකථන, අන්තර්ජාලය, ආරක්ෂක සේවය, පිරිසිදු කිරීමේ සේවාව හා ගොඩනැගිලි නඩත්තු කටයුතු.

4. සියලුම ගෙවීම් අනුමත කිරීම - වැටුප්, උපාධිධාරී පුහුණු දීමනාව, අතිකාල, උපයා ගැනීමට යටත්ව ගෙවනු ලබන වැටුපෙන් හතරෙන් එකක් වන දීමනාව ගෙවීම සහ අනෙකුත් ගෙවීම්.

5. කොමිෂන් සභා සාමාජිකයින්ගේ සියලුම පරිපාලන කටයුතු.

6. නිලධාරීන්ගේ ණය කටයුතු - ආපදා ණය, උත්සව අත්තිකාරම් සහ විශේෂ අත්තිකාරම්, දේපළ ණය හා අනෙකුත් ණය සම්බන්ධ කටයුතු.

7. මානව සම්පත් සංවර්ධන වැඩසටහන් - දේශීය හා විදේශීය පුහුණුවීම් සඳහා නිලධාරීන් යොමු කිරීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ සංවිධානය කිරීම.

8. අනෙකුත් පරිපාලන කටයුතු - නියමිත වේලාවට වාර්තා යැවීම.

ඉ. ගිණුම් අංශය

1. මූල්‍ය රෙගුලාසි, රජයේ චක්‍රලේඛ සහ මාර්ගෝපදේශවල විධිවිධානවලට අනුකූලව මුදල් කොමිෂන් සභා කාර්යාලයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන අයවැය සම්බන්ධයෙන් මූල්‍ය කළමනාකරණය.

2. ප්‍රසම්පාදනයට අදාළ ක්‍රියාකාරකම්වල කාර්යසාධනය.

3. මුදල් කොමිෂන් සභා කාර්යාලයේ වත්කම් කළමනාකරණය.

4. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම.

5. රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම නියමිත සීමාවන් තුළ පවත්වා ගැනීම සහ ඒවායෙහි වාර්ෂික සැසඳුම් වාර්තා ඉදිරිපත් කිරීම.

6. මුදල් කොමිෂන් සභා කාර්යාලයට අදාළ අභ්‍යන්තර හා සාමාන්‍ය විගණන කටයුතු සහ රාජ්‍ය ගිණුම් කටයුතු හා සම්බන්ධ වීම.

ඊ. අභ්‍යන්තර විගණන අංශය

1. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.

2. මුදල් කොමිෂන් සභාවේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම පිණිස අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීම සහ එවැනි පාලන පද්ධතිවල කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා නිසි පිළිවෙත් යෝජනා කිරීම.

3. ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, චක්‍රලේඛ සහ රෙගුලාසි ආදිය සම්බන්ධයෙන් කොමිෂන් සභා කාර්යාලයේ ක්‍රියාකාරී සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල අනුකූලතාවය තක්සේරු කිරීම හා නිවැරදි කිරීම සහ වැඩිදියුණු කිරීම් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

1.5 මුදල් කොමිෂන් සභාවේ සංවිධාන සටහන



නි.අ/ස.අ.	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	තා.නි.	තාක්ෂණික නිලධාරි
පරි.නි.	පරිපාලන නිලධාරි	තො. සං.තා.ස.	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහකාර
භා. ප.	භාෂා පරිවර්තක	ක.සේ.නි.	කළමනාකරණ සේවා නිලධාරී
තො.සං.තා. නි.	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නිලධාරි	වි.කා	විදුලි කාර්මික
සංඛ්‍යා.නි.	සංඛ්‍යාලේඛන නිලධාරි	කා.කා.ස.	කාර්යාල කාර්ය සහයක
සං.නි.	සංවර්ධන නිලධාරි		

1.6 කොමිෂන් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

මුදල් කොමිෂන් සභාව යටතේ කිසිදු ආයතනයක් පිහිටුවා නැත. මුදල් කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ දක්වා ඇති ස්වාධීන කොමිෂන් සභාවලින් එකකි.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

මුදල් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලද විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති නොමැත.

අ) ව්‍යාපෘතියේ නම	අදාළ නොවේ
ආ) දායක නියෝජිතායතනය	
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු. මි.	
ඈ) ව්‍යාපෘති කාල සීමාව	

පරිච්ඡේදය - 02: ප්‍රගතිය සහ අනාගත දැක්ම

2.1 ප්‍රගතිය

මුදල් කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියමයන්ට අනුව සහ ක්‍රියාකාරී සැලැස්මේ අදාළ කාල රාමුවට අනුකූලව පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් 2025 වර්ෂය තුළ දී ඉටු කරන ලදි.

2.1.1 පළාත් ප්‍රාග්ධන අයවැයට අදාළ කරුණු

I. 2026 වර්ෂය සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා සකස් කිරීමට මාර්ගෝපදේශ පළාත් සභා වෙත නිකුත් කිරීම

2026 වර්ෂය සඳහා පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වන මාර්ගෝපදේශ 2025 පෙබරවාරි 11 වන දින සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත නිකුත් කරන ලදි. මුදල් කොමිෂන් සභාව එහි ව්‍යවස්ථාපිත කාර්යයභාරයට අනුව පළාත් සභා සඳහා ඉදිරි වර්ෂයේ ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය අරමුදල් රජයේ වාර්ෂික අයවැයෙන් වෙන් කර ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට වාර්ෂිකව පළාත් සභාවල මූල්‍ය අවශ්‍යතා තක්සේරු කරනු ලබයි. පළාත් සභාවල ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් සඳහා වාර්ෂික සම්පත් අවශ්‍යතාව තාර්කික ලෙස පිළියෙළ කර ඉදිරිපත් කිරීම සඳහා මෙම මාර්ගෝපදේශ සහාය වේ.

II. 2025 පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීම සහ එකඟතාවය ලබා දීම

මුදල් කොමිෂන් සභාව විසින් 2024 දෙසැම්බර් 29 දින නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුව, 2025 සඳහා වූ පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් (ADPs) පළාත් සභා නවය විසින් මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබුණි.

සෑම සංවර්ධන සැලැස්මක්ම ගැඹුරින් අධ්‍යයනය කරන ලද අතර, එම සැලසුම්වල අවශ්‍යතැන්හි පැහැදිළි කර ගැනීම් සහ අවශ්‍ය අමතර තොරතුරු ලබා ගැනීම සඳහා මාර්ගගත තාක්ෂණය ඔස්සේ විස්තරාත්මක සාකච්ඡා මාලාවක් පවත්වන ලදි. මුදල් කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන්, පත් කරන ලද කොමිෂන් සභා සාමාජිකයින්, කොමිෂන් සභාවේ ලේකම්, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ පළාත්වල ගරු ආණ්ඩුකාරවරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (සැලසුම් හා මූල්‍ය), දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් සභාවල අනෙකුත් අදාළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් මෙම රැස්වීම් පැවැත්විණි.

2025 වසරේ පළමු කාර්තුව අවසන් වන විට සියලුම පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කර අවසන් කරන ලද අතර සමාලෝචන රැස්වීම්වලදී කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ මත අවශ්‍ය සංශෝධනවලට යටත්ව එක් එක් සැලැස්මේ පුළුල් ක්‍රියාකාරකම් පරාස දක්වා ප්‍රතිපත්තිමය එකඟතාව ලබා දෙන ලදි.

පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් මුදල් කොමිෂන් සභාව වෙත ලැබුණු දිනයන්, සමාලෝචන රැස්වීම් පැවැත් වූ දිනයන් සහ එම සැලසුම් සඳහා එකඟතාව ලබාදුන් දිනයන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

වගුව 01: 2025 වර්ෂයට පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සඳහා එකඟතාවය ලබාදුන් දිනයන්

පළාත	පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් ලැබුණු දිනය	සමාලෝචන රැස්වීම පැවැත් වූ දිනය	සැලසුම් සඳහා එකඟතාවය ලබාදුන් දිනය
බස්නාහිර	2025.02.20	2025.03.21	2025.04.02
මධ්‍යම	2025.03.04	2025.03.28	2025.04.11
දකුණු	2025.02.13	2025.03.06	2025.03.29
උතුරු	2025.02.13	2025.03.11	2025.03.29
වයඹ	2025.02.24	2025.03.19	2025.04.01
උතුරු මැද	2025.02.18	2025.03.18	2025.04.01
ඌව	2025.02.19	2025.03.25	2025.04.03
සබරගමුව	2025.02.24	2025.03.12	2025.03.29
නැගෙනහිර	2025.02.14	2025.03.14	2025.03.29

III. 2025 පළාත් නඩත්තු ක්‍රියාකාරකම් සැලැසුම් සමාලෝචනය කිරීම සහ එකඟතාවය ලබා දීම

රජයේ සීමිත මූල්‍ය අවකාශය තුළ පළාත්වල ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් සපුරාලීම අභියෝගයක් වී ඇති බැවින්, අනාගතයේදී අනවශ්‍ය ලෙස ප්‍රතිසංස්කරණ සඳහා විශාල වශයෙන් වියදම් දැරීමට සිදුවීම වළක්වාලමින් පවත්නා පළාත් ප්‍රාග්ධන වත්කම් නිසි පරිදි නඩත්තු කිරීම තහවුරු කිරීමට ප්‍රමාණවත් අරමුදල් වෙන් කර දෙන ලෙසට මුදල් කොමිෂන් සභාව විසින් මහා භාණ්ඩාගාරයට යෝජනා කරන ලදි. ඒ අනුව, ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම සඳහා එක් එක් පළාත් සභාවට පුනරාවර්තන වියදම් යටතේ වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන ලබා දීමට කොමිෂන් සභාව නිර්දේශ කරන ලදි.

මෙම නිර්දේශයට ප්‍රතිචාර ලෙස, පළාත් ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම සඳහා රු. මිලියන 25,000 ක ප්‍රතිපාදනයක් භාණ්ඩාගාරය විසින් 2025 වාර්ෂික අයවැය මඟින් වෙන් කරන ලදි. ඒ අනුව, ප්‍රධාන අංශ සඳහා නඩත්තු ක්‍රියාකාරකම් සැලසුම් සකස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ මුදල් කොමිෂන් සභාව විසින් 2024 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අතර එම මාර්ගෝපදේශවලට අනුකූලව සකස් කරන ලද නඩත්තු ක්‍රියාකාරකම් සැලසුම් මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා ගැනීම සඳහා පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලදි.

ඒ අනුව, නඩත්තු සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාව ලබා දුන් දිනයන් පහත පරිදි වේ.

වගුව 02: නඩත්තු සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාව ලබා දුන් දිනයන්

පළාත	නඩත්තු ක්‍රියාකාරී සැලැස්ම මුදල් කොමිෂන් සභාව වෙත ලැබුණු දිනය	එකඟතාව ලබාදුන් දිනය
බස්නාහිර	2025.04.25	2025.04.29
මධ්‍යම	2025.03.04	2025.04.10
දකුණු	2025.04.17	2025.04.29
උතුරු	2025.02.20	2025.04.10
වයඹ	2025.02.28	2025.04.10
උතුරු මැද	2025.02.19	2025.04.10
ඌව	2025.04.09	2025.04.10
සබරගමුව	2025.04.03	2025.04.10
නැගෙනහිර	2025.02.14	2025.04.10

IV. 2025 වර්ෂය සඳහා පාසල් පෝෂණ ආහාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට මාර්ගෝපදේශ නිකුත් කිරීම

2025 වර්ෂයේ පාසල් පෝෂණ ආහාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පළාත් සභා නවය සඳහා රු.බිලියන 32 ක ප්‍රතිපාදනයක් අයවැයෙන් වෙන් කරන ලදි. ඒ අනුව, 2025 වර්ෂයේ පාසල් පෝෂණ ආහාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ 2025 ජනවාරි 09 දින පළාත් සභා වෙත නිකුත් කරන ලදි. මෙම මාර්ගෝපදේශ නිකුත් කිරීමේ අරමුණ වූයේ, පාසල් පෝෂණ ආහාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අනෙකුත් අදාළ අංශ සඳහා පළාත් සභා වෙත ලබාදුන් ප්‍රතිපාදන කාර්යක්ෂම සහ ඵලදායී ලෙස ඒකාබද්ධව භාවිතා කිරීමට අවශ්‍ය මග පෙන්වීමය. මෙහිදී පාසල් දරුවන්ට වඩාත් හොඳ පෝෂ්‍යදායී ආහාර වේලක් සැපයීම මගින් ඔවුන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමට මෙම වැඩසටහන සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන මාර්ගෝපදේශවල සඳහන් කරුණු අනුව පළාත් සභා විසින් උපයෝජනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

V. විශේෂ සංවර්ධන ව්‍යාපෘති යටතේ ව්‍යාපෘති යෝජනා සකස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීම - 2025

විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා 2025 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) යටතේ ලබා දී ඇති ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් ව්‍යාපෘති යෝජනා සකස් කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ මුදල් කොමිෂන් සභාව විසින් 2025.01.24 දින නිකුත් කරන ලදි. තවද, විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම පිළිබඳව පළාත් නිලධාරීන් දැනුවත් කිරීමේ රැස්වීමක් කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පළාත් ප්‍රධාන ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (සැලසුම්) සහ පළාත් ආයතනවල අනෙකුත් අදාළ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025 ජනවාරි 31 දින මාර්ගගත තාක්ෂණය ඔස්සේ පවත්වන ලදි. නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂා කරනු ලබන ප්‍රතිඵල අත්කර ගැනීමට හැකි වන පරිදි සුදුසු ව්‍යාපෘති හඳුනාගෙන යෝජනා සකස් කිරීමට පළාත් සභාවලට අවශ්‍ය වැඩිදුර උපදෙස් මෙම රැස්වීමේදී ලබා දෙන ලදි.

VI. ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන

2025 වර්ෂයේදී "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ සියලුම පළාත් සභාවල අධ්‍යාපන අංශය සහ බස්නාහිර පළාතේ පළාත් පාලන අංශය සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් අරමුදල් වෙන් කර දී තිබුණි. මෙම වැඩසටහන යටතේ විවිධ සංරචකයන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය මාර්ගෝපදේශ පළාත් සභාවන් වෙත සැපයීමද මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරන ලදි.

(අ) "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන - පළාත් පාසල් අංශය

පළාත් පාසල්වල පහත සඳහන් ව්‍යාපෘති ත්‍රිත්වය ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන - 2025 යටතේ රු. මිලියන 760 ක මුදලක් පළාත් සභා වෙත වෙන් කර දී තිබුණි.

i. පළාත් පාසල්වල ආරක්ෂිත ඉගෙනුම් පරිසරයක් සහතික කිරීම සඳහා පාසල් ගොඩනැගිලි හා යටිතල පහසුකම්වල අත්‍යවශ්‍ය අලුත්වැඩියා සහ නඩත්තු කිරීම - රු. මිලියන 250

ii. සුවපහසු ඉගෙනුම් පරිසරයක් තහවුරු කිරීම සඳහා හඳුනාගත් පළාත් පාසල්වල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම - රු. මිලියන 500

iii. "ක්ලීන් ශ්‍රී ලංකා" සංකල්පයට අදාළව පාසල් ප්‍රජාවන් සඳහා ආකල්ප හා ආචාර ධර්ම ඉලක්ක කරගත් දැනුවත් කිරීමේ වැඩසටහන් - රු. මිලියන 10

ඉහත සඳහන් ප්‍රතිපාදන පළාත් නවය අතර බෙදා වෙන් කිරීම කොමිෂන් සභාව විසින් සිදු කරන ලද අතර, ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට පළාත් සභාවන්ට පහසුකම් සැලසීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් 2025 අප්‍රේල් 29 දින නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව සියලුම පළාත් සභා විසින් ක්‍රියාකාරී සැලසුම් සකස් කර ඉදිරිපත් කරන ලදි. ඉහත වැඩසටහන් පිළිබඳ සමාලෝචන රැස්වීමක් සියලුම පළාත්වල ප්‍රධාන ලේකම්වරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය (ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලය), ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (සැලසුම්) සහ අදාළ අනෙකුත් පළාත් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025 මැයි 20 දින මාර්ගගත තාක්ෂණය ඔස්සේ පවත්වන ලදි. යෝජිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා 2025 මැයි 23 දින ප්‍රතිපත්තිමය එකඟතාව ලබා දෙන ලදි.

(ආ) "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන - පළාත් පාලන අංශය (බස්නාහිර පළාත)

2025 වර්ෂයේ "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ බස්නාහිර පළාතේ, පළාත් පාලන අංශය සඳහා පහත සඳහන් ව්‍යාපෘති වෙනුවෙන් රු. මිලියන 432.6 ක මුදලක් වෙන් කර තිබුණි.

i. ජෛව හායනයට ලක් නොවන අපද්‍රව්‍ය එකතු කිරීම සහ සැකසීම සඳහා නව සැකසුම් මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම (ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයක්) - කරදියාන රු.මිලියන 222.6

ii. ඝන අපද්‍රව්‍ය භාවිතයෙන් කොම්පෝස්ට් සකස් කිරීමේ ඒකක ඉදිකිරීම - කරදියාන - රු.මිලියන 100

iii. මාලිගාවත්ත ප්‍රදේශයේ අපජල පද්ධතියක් ඉදිකිරීම - රු.මිලියන 50

iv. ජංගම CCTV පද්ධතියක් මගින් නිරීක්ෂණය කර නීති විරෝධී ලෙස සිදු කරන අපද්‍රව්‍ය බැහැර කිරීම අවම කිරීම - රු. මිලියන 10

v. බස්නාහිර පළාතේ තෝරාගත් පළාත් පාලන ආයතන සඳහා රථ වාහනවල පවත්වාගෙන යනු ලබන ජංගම පුස්තකාල 10ක් සඳහා පහසුකම් සැලසීම - රු.මිලියන 50

මුදල් කොමිෂන් සභාව විසින් 2025 මැයි 22 දින මෙම ප්‍රතිපාදනවලට අදාළව ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සඳහා ලබා දුන් මාර්ගෝපදේශ අනුව, බස්නාහිර පළාත් සභාව විසින් ඉහත (i), (ii) සහ (iii) ව්‍යාපෘති සඳහා ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත් කරන ලදි.

ඒ අනුව, බස්නාහිර පළාත් සභාව, බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සහ කොළඹ මහ නගර සභාවේ නිලධාරීන් ද, ජනාධිපති ලේකම් කාර්යාලය (ක්ලීන් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලය), ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ද සහභාගීත්වයෙන් 2025 ජුනි 18 දින මුදල් කොමිෂන් සභාවේ පැවති සාකච්ඡාවෙන් පසු, ඉහත (i), (ii) සහ (iii) ව්‍යාපෘතිවල ක්‍රියාකාරී සැලසුම් සඳහා 2025 ජුනි 20 දින ප්‍රතිපත්තිමය එකඟතාව ලබා දෙන ලදි. බස්නාහිර පළාත් සභාව විසින් (iv) සහ (v) ව්‍යාපෘති සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලසුම් සමාලෝචනය කිරීමෙන් පසු ඒ සඳහා ප්‍රතිපත්තිමය එකඟතාව 2025 ජූලි 01 දින ලබා දෙන ලදි.

VII. 2026 වර්ෂය සඳහා පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම

පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (3) සහ (4) වගන්ති යටතේ රජයට සහ ගරු ජනාධිපතිතුමා වෙත ඊට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වූ පූර්ව අවශ්‍යතාවයකි.

මුදල් කොමිෂන් සභාව විසින් 2025 පෙබරවාරි 11 වැනි දින නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුව සියලුම පළාත් සභා විසින් 2026 සඳහා වූ සිය ප්‍රාග්ධන අවශ්‍යතා ඉදිරිපත් කරන ලදි.

පළාත් විසින් ප්‍රාග්ධන අවශ්‍යතා ඉදිරිපත් කරන ලද දිනයන් පහත පරිදි වේ.

වගුව 03: පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා ඉදිරිපත් කරන ලද දිනයන්

පළාත	පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා ලැබුණු දිනය
බස්නාහිර	2025.05.15
මධ්‍යම	2025.06.05
දකුණු	2025.04.04
උතුරු	2025.03.26
වයඹ	2025.05.22
උතුරු මැද	2025.04.03
ඌව	2025.05.16
සබරගමුව	2025.04.29
නැගෙනහිර	2025.02.15

පළාත් සභා වෙත විමධ්‍යගත කරන ලද විෂයන් 23ක් සඳහා උපයෝජනය කිරීමේ අරමුණින්, 2026 වර්ෂය සඳහා වූ ප්‍රාග්ධන වියදම් අවශ්‍යතාවය තක්සේරු කරන ලදි. තවද, රජයේ වාර්ෂික අයවැයෙන් ලබා දෙන ප්‍රතිපාදන රටෙහි තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් අත්පත් කරගැනීමේ අරමුණින් තාර්කික ආකාරයෙන් පළාත් අතර බෙදා දීම සඳහා ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මුදල් කොමිෂන් සභාව විසින් සකසන ලද විද්‍යාත්මක සංඛ්‍යානමය සූත්‍රය මත පදනම්ව සිදු කරන ලදි.

VIII. 2026 පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීමට අදාළ මාර්ගෝපදේශ නිකුත් කිරීම

2026 වර්ෂය සඳහා පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමේ අරමුණින් 2026 පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් (ADPs) සකස් කිරීම සඳහා වන මාර්ගෝපදේශ 2025 ඔක්තෝබර් 07 වන දින ඉතා කල්තියා (පසුගිය වසරට සාපේක්ෂව) නිකුත් කරන ලදි. ඉදිරි වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත සම්මත වීමෙන් පසුව පමණක් එම වර්ෂයට ලැබෙන ප්‍රතිපාදන පිළිබඳ තොරතුරු පළාත් සභා වෙත දැනුම් දුන් නිසා පෙර වසරවල පළාත් සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී සිදු වූ ප්‍රමාදයන් වළක්වා ගැනීමේ අරමුණින් මෙසේ සිදු කරන ලදි.

2026 වර්ෂය සඳහා පළාත් සභා සඳහා වෙන් කරන ලද අරමුදල් මහජනතාවට උපරිම ප්‍රතිලාභ ලබා දෙමින් කාර්යක්ෂම/ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කිරීම සඳහා වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීමට මෙම මාර්ගෝපදේශ මගින් උපදෙස් දෙනු ලැබේ. මෙම සංවර්ධන සැලසුම් පළාත් සභාවල මධ්‍ය කාලීන සංවර්ධන සැලසුම්වලට අනුකූලව, වර්තමාන රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව සහ රටේ හා විශේෂයෙන් එක් එක් පළාතේ සංවර්ධන ප්‍රමුඛතා මත පදනම්ව සකස් කිරීමට අවධානය යොමු කරවා ඇත.

IX. 2026 නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ

පළාත් ප්‍රාග්ධන වත්කම් නඩත්තු කටයුතු සඳහා රු. මිලියන 27,500 ක ප්‍රතිපාදනයක් මහා භාණ්ඩාගාරය විසින් 2026 වාර්ෂික අයවැය මගින් වෙන් කරන ලදි. ඒ අනුව, මෙම ප්‍රතිපාදන ද පළාත් සංවර්ධන ආයෝජනවල කොටසක් ලෙස සැලකිය යුතු බැවින් සහ සීමිත අරමුදල් විචක්ෂණශීලී ලෙස උපයෝජනය කිරීමට හා මේ සඳහා වෙන් කරන ලද අරමුදල් ඵලදායී ලෙස භාවිතා කිරීමේ අරමුණින් 2026 වසර සඳහා නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ මාර්ගෝපදේශ 2025 නොවැම්බර් 20 වැනි දින මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලදි. ඒ අනුව, ප්‍රතිපාදනවලින් 60%කට වඩා වැඩි

ප්‍රමාණයක් සාමාන්‍ය ජනතාවට සෘජුවම සේවා සපයන වත්කම් නඩත්තු කිරීම සඳහා යෙදවිය යුතු බවට මාර්ගෝපදේශ මගින් උපදෙස් ලබා දී ඇත.

X. පාසල් පෝෂණ ආහාර වැඩසටහන සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම - 2026

පාසල් පෝෂණ ආහාර වැඩසටහන - 2026 ක්‍රියාත්මක කිරීමට පළාත් සභා සඳහා රු. මිලියන 33,500 ක අයවැය ප්‍රතිපාදන ලබා දී ඇත. ඒ අනුව, වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වෙන් කරන ලද මුදල් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කිරීමට පළාත් සභාවලට පහසුකම් සැලසීම සඳහා මාර්ගෝපදේශ සකස් කර 2025 නොවැම්බර් 20 වන දින පළාත් සභා වෙත යවන ලදි. ඒ අනුව, දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් පාසල් සිසුන්ට පෝෂ්‍යදායී ආහාර වේලක් ලබාදීම සඳහා මෙම මාර්ගෝපදේශ නිසිලෙස සැලකිල්ලට ගනිමින් මෙම වැඩසටහන සඳහා ලබා දෙන මුදල් පළාත් සභා විසින් යොදවනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආහාර වේලට වැඩි වටිනාකමක් එකතු කිරීම සඳහා කෘෂිකර්මය, පශු සම්පත්, මිරිදිය ධීවර කර්මාන්තය වැනි අනෙකුත් අංශ සමඟ ඒකාබද්ධව වැඩසටහන ක්‍රියාත්මක කරන ලෙස පළාත්වලට උපදෙස් ලබා දී ඇත.

XI. විශේෂ සංවර්ධන ව්‍යාපෘති යටතේ ව්‍යාපෘති යෝජනා සකස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීම - 2026

විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා 2026 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) යටතේ ලබා දී ඇති ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින්, ඵලදායී ලෙස භාවිතා කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සහතික කිරීමේ අරමුණින් ව්‍යාපෘති යෝජනා සකස් කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ මුදල් කොමිෂන් සභාව විසින් 2025 නොවැම්බර් 20 දින නිකුත් කරන ලදි. ඒ අනුව, ප්‍රතිලාභින්ගේ පවුල්වල ආදායම් තත්ත්වය ඉහල නංවාලන රැකියා අවස්ථා උත්පාදනය කරනු ලබන ව්‍යවසායකත්ව ව්‍යාපෘති සඳහා මෙම ප්‍රතිපාදන යෙදවීමට හැකිවන පරිදි ව්‍යාපෘති යෝජනා හඳුනා ගන්නා ලෙස උපදෙස් ලබා දී ඇත.

XII. 2026 වාර්ෂික සංවර්ධන සැලසුම් ඉදිරිපත් කිරීම සඳහා සාකච්ඡාව

2026 පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කර ඉදිරිපත් කිරීම පිළිබඳ පළාත් සභා නිලධාරීන් දැනුම්වත් කිරීමේ සාකච්ඡාවක් පළාත් ගරු ආණ්ඩුකාරවරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (සැලසුම් හා මූල්‍ය) යන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025 නොවැම්බර් 06 දින මාර්ගගත තාක්ෂණය ඔස්සේ මුදල් කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද අතර, ඒ සඳහා කොමිෂන් සභාවේ ලේකම්වරයා ඇතුළු අනෙකුත් නිලධාරීන්ද සහභාගී විය.

2026 වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම පිළිබඳ මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවල අන්තර්ගත වැදගත් කරුණු සාකච්ඡා කිරීම සහ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මගින් දිරිමත් කර ඇති පරිදි පළාත් සභා හා පළාත් පාලන ආයතන විනිවිදභාවය හා මූල්‍ය වගකීමක් සහිතව කටයුතු කිරීම සඳහා පළාත් මූල්‍ය රෙගුලාසිවලට අනුව ව්‍යාපෘති ඇගයීම් ක්‍රියාවලියට අනුගත වීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම මෙම රැස්වීමේ අරමුණ විය. ඒ අනුව, වාර්ෂික සංවර්ධන සැලසුම්වලට ව්‍යාපෘති ඇතුළත් කිරීමට පෙර ඒවා නිසි ලෙස ඇගයීම සඳහා පළාත් සැලසුම් කමිටුව සහ අමාත්‍යාංශ මට්ටමේ සැලසුම් ඒකකය සක්‍රීයව ක්‍රියාත්මක වන බවට වග බලා ගන්නා ලෙස පළාත් සභාවලට උපදෙස් දෙන ලදි.

XIII. 2026 පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සමාලෝචනය කිරීම සහ එකඟතාවය ලබා දීම

මුදල් කොමිෂන් සභාව විසින් 2025 ඔක්තෝබර් 7 වන දින නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුව 2026 සඳහා වූ පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් (ADPs) පළාත් සභා නවයෙන් මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබුණි.

සෑම සැලැස්මක්ම ගැඹුරින් අධ්‍යයනය කරන ලද අතර, අවශ්‍ය තැන්හි පැහැදිළි කර ගැනීම් කර ගැනීම සහ අමතර තොරතුරු ලබා ගැනීම සඳහා මාර්ගගත තාක්ෂණය ඔස්සේ විස්තරාත්මක සාකච්ඡා මාලාවක් පවත්වන ලදි (බස්නාහිර පළාත් සභාවේ සාකච්ඡාව එම පළාත් සභාවේදී පවත්වන ලදි). මුදල් කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් සහ පත් කරන ලද කොමිෂන් සභා සාමාජිකයින්, කොමිෂන් සභාවේ ලේකම්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මේ සඳහා සහභාගී වූහ. පළාත් නියෝජනය කරමින් පළාත්වල ගරු ආණ්ඩුකාරවරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (සැලසුම් හා මූල්‍ය), දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් සභාවල අනෙකුත් අදාළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙම රැස්වීම් සඳහා සහභාගී විය.

මෙම සාකච්ඡාවලදී පළාත්වල ජනතාවට උපරිම ප්‍රතිලාභ ලබා දීම සඳහා විචක්ෂණශීලීව සහ ඵලදායී ලෙස අරමුදල් යෙදවීමේ අරමුණ ඇතිව සැලසුම් මනාව සමාලෝචනය කර නිරීක්ෂණ සහ නිර්දේශ ඉදිරිපත් කරන ලදි. ඉන්පසුව, සාකච්ඡාවට බඳුන් වූ යම් යම් සංශෝධනවලට යටත්ව සංවර්ධන සැලසුම්වල පුළුල් ක්‍රියාකාරකම් පරාස දක්වා ප්‍රතිපත්තිමය වශයෙන් විධිමත් එකඟතාව පළාත් නවය සඳහාම 2025 දෙසැම්බර් 31 දිනට පෙර පළාත් බලධාරීන්ට ලබා දෙන ලදි.

2025 දෙසැම්බර් 31 වැනි දිනට පෙර එකඟතාව ලබා දී ඇති බැවින්, 2026 වසර අවසානයේ දී ඉහළ මූල්‍ය හා භෞතික ප්‍රගතියක් ලබා ගැනීම සහතික කරමින් සංවර්ධන සැලැස්මේ ක්‍රියාකාරකම් ප්‍රමාදයකින් තොරව 2026 වසර ආරම්භයේ සිටම ක්‍රියාත්මක කිරීමට මෙමඟින් අවස්ථාව සලසා දී ඇත.

වගුව 04: 2026 වර්ෂයට පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සඳහා එකඟතාව ලබාදුන් දිනයන්

පළාත	පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් ලැබුණු දිනය	සමාලෝචන රැස්වීම පැවැත් වූ දිනය	සැලසුම් සඳහා එකඟතාව ලබාදුන් දිනය
බස්නාහිර	2025.11.19	2025.12.10	2025.12.29
මධ්‍යම	2025.11.17	2025.12.03	2025.12.29
දකුණු	2025.11.17	2025.12.02	2025.12.29
උතුරු	2025.11.21	2025.12.15	2025.12.29
වයඹ	2025.11.14	2025.12.05	2025.12.26
උතුරු මැද	2025.11.24	2025.12.17	2025.12.29
ඌව	2025.11.19	2025.12.13	2025.12.29
සබරගමුව	2025.11.25	2025.12.19	2025.12.30
නැගෙනහිර	2025.11.14	2025.11.27	2025.12.26

XIV. 2025 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදානයන්

2025 වර්ෂය සඳහා පළාත් විසින් ඉල්ලුම් කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණයන්, මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශිත ප්‍රතිපාදන ප්‍රමාණයන්, 2025 වර්ෂය සඳහා අයවැය මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයන් සහ භාණ්ඩාගාරයෙන් නිදහස් කරන ලද අක්මුදල් ප්‍රමාණයන්හි සාරාංශය පහත වගුවෙන් දැක්වේ.

වගුව 05: 2025 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදානයන්ගේ සාරාංශය

(රු.මිලියන)

පළාත	පළාත් විසින් ඉල්ලූ අවශ්‍යතාවය (a)	නිර්දේශිත ප්‍රමාණය			අයවැය මගින් වෙන් කිරීම			නිදහස් කරන ලද අක්මුදල			නිදහස් කරන ලද අක්මුදල, අයවැය මගින් වෙන් කරනු ලැබූ ප්‍රතිපාදනයේ % ලෙස e = (d/c*100)
		පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන	උපමාන පාදක ප්‍රදාන	එකතුව (b)	පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන	උපමාන පාදක ප්‍රදාන	එකතුව (c)	පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන	උපමාන පාදක ප්‍රදාන	එකතුව (d)	
බස්නාහිර	16,429	13,538	1,658	15,196	5,894	585	6,479	5,800	585	6,385	99
මධ්‍යම	9,754	16,905	2,070	18,975	7,360	730	8,090	6,010	725	6,735	83
දකුණු	15,675	16,023	1,962	17,985	6,976	692	7,668	5,769	692	6,461	84
උතුරු	20,561	16,832	2,061	18,893	7,328	727	8,055	7,328	727	8,055	100
වයඹ	19,905	15,700	1,922	17,622	6,835	678	7,513	6,493	678	7,171	95
උතුරු මැද	7,843	16,111	1,973	18,084	7,014	696	7,710	5,007	679	5,685	74
ඌව	11,117	17,655	2,162	19,817	7,688	763	8,451	5,382	534	5,916	70
සබරගමුව	13,330	17,420	2,133	19,553	7,584	753	8,337	3,049	386	3,435	41
නැගෙනහිර	62,634	16,816	2,059	18,875	7,321	726	8,047	6,590	703	7,293	91
එකතුව	**177,248**	**147,000**	**18,000**	**165,000**	**64,000**	**6,350**	**70,350**	**51,427**	**5,709**	**57,136**	**81**

2.1.2 පළාත් පුනරාවර්තන අයවැයට අදාළ කරුණු

I. 2026 වසර සඳහා පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීම

2026 වර්ෂය සඳහා පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම පිළිබඳ මාර්ගෝපදේශ 2025 මාර්තු 07 වන දින පළාත් සභා වෙත නිකුත් කිරීමත් සමග පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය ආරම්භ විය. මෙම මාර්ගෝපදේශ, ප්‍රධාන වශයෙන් පුද්ගල පඩිනඩි, අනෙකුත් පුනරාවර්තන වියදම්, පළාත් පාලන ආයතනවලට මාරු කිරීම් සහ පළාත් ආදායම් ඇස්තමේන්තු යනාදී කරුණු මත පදනම් වේ. පුනරාවර්තන මාර්ගෝපදේශ සමග සාමූහික ප්‍රදාන ඉල්ලීම සඳහා පළාත් සභා විසින් සම්පූර්ණ කළ යුතු ආකෘති පත්‍ර කට්ටලයක් ද ලබා දී ඇත.

II. 2026 වර්ෂය සඳහා පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම

පළාත් සභා විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද තම පුනරාවර්තන අවශ්‍යතා ඇතුළත් ආකෘති පත්‍ර, මාර්ගෝපදේශය සමග අමුණා ඇති දින දර්ශනයට අනුව මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදි. ඒ අනුව, 2026 වර්ෂය සඳහා පළාත් පුනරාවර්තන අවශ්‍යතා පිළිබඳව පළාත් බලධාරීන් සමඟ සාකච්ඡා කර තක්සේරු කරන ලදි. මේ සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන්, පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අයවැය අධ්‍යක්ෂවරුන් ඇතුළු අනෙකුත් අදාළ පළාත් නිලධාරීන් සමග රැස්වීම් කිහිපයක් පැවැත් වූ අතර, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් ද ඊට සහභාගී වූහ.

පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම සම්බන්ධයෙන් පවත්වනු ලැබූ වාර්ෂික අයවැය සාකච්ඡා කාලසටහන පහත දැක්වේ.

වගුව 06: වාර්ෂික අයවැය සාකච්ඡා පවත්වනු ලැබූ කාලසටහන

පළාත	සාකච්ඡා පැවැත්වූ දිනයන්
බස්නාහිර	2025.07.16
මධ්‍යම	2025.07.02
දකුණු	2025.07.09
උතුරු	2025.07.07
වයඹ	2025.07.18
උතුරු මැද	2025.07.22
ඌව	2025.07.14
සබරගමුව	2025.07.11
නැගෙනහිර	2025.06.30

III. පළාත් පුනරාවර්තන අවශ්‍යතා පිළිබඳ නිර්දේශ මහා භාණ්ඩාගාරයට දැනුම් දීම

පළාත් බලධාරීන් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කර එම අගයන් 2026 ජාතික අයවැය සකස් කිරීමේදී සලකා බැලීම සඳහා මහා භාණ්ඩාගාරයට යොමු කරන ලදි. ඒ අනුව, පළාත් සභා සඳහා නිර්දේශිත සාමූහික ප්‍රදානය ලෙස රු.මිලියන 692,416 ක මුදලක් 2025.08.14 දින මහා භාණ්ඩාගාරයට දැනුම් දෙන ලදි (පළාත් පාලන ආයතන වෙත ආදායම් මාරු කිරීම, අවිනිශ්චිත අරමුදල සහ අත්තිකාරම් "බී" ගිණුම සඳහා වෙන්කිරීම් ද ඇතුළුව).

IV. 2026 වසරේ පළාත්වලට වෙන් කරන ලද මුදල් ප්‍රමාණයන් දැනුම් දීම

2026 වසර සඳහා විසර්ජන පනත් කෙටුම්පත මගින් පළාත් සභා සඳහා අනුමත කරන ලද පුනරාවර්තන අයවැය සඳහා වූ ප්‍රතිපාදන ප්‍රමාණය 2025.11.14 වන දින මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභා වෙත දැනුම් දෙන ලදි. 2026 වසර සඳහා ජාතික අයවැයෙන් වෙන් කරන ලද මුළු පුනරාවර්තන ප්‍රතිපාදනය රු.මිලියන 586,974.50 කි (පළාත් ආදායම් ද ගැලපීමෙන් අනතුරුව).

V. 2025 වර්ෂය සඳහා අමතර ප්‍රතිපාදන නිර්දේශ කිරීම

පළාත් සභා විසින් අතිරේක ප්‍රතිපාදන සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරන ලද්දේ ප්‍රධාන වශයෙන් අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ වැටුප් සංශෝධනය කිරීම, අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පසුව රේඛීය අමාත්‍යාංශ මගින් පත්කළ කාර්යමණ්ඩල අනුයුක්ත කිරීම්, නව බඳවා ගැනීම් සහ ආරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවා වියදම් වැඩිවීම හේතුවෙනි. ඒ අනුව, 2025 වසරේ දී නිර්දේශිත අතිරේක ප්‍රතිපාදන ප්‍රමාණයන් පහත පරිදි වේ;

වගුව 07: නිර්දේශිත අතිරේක ප්‍රතිපාදන - 2025

දිනය	අතිරේක ප්‍රතිපාදන සඳහා මුළු නිර්දේශ කිරීම් (රු.මිලියන)
2025.09.16	30,632.82
2025.10.22	1,397.00
2025.10.27	7,488.07
2025.12.08	446.99

VI. 2026 වසර සඳහා පළාත් ආදායම් තක්සේරුව

2025 මාර්තු 07 වන දින මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද පුනරාවර්තන අයවැය අවශ්‍යතා තක්සේරු කිරීමට අදාළ මාර්ගෝපදේශයට අනුව, පළාත් සභා විසින් ඔවුන්ගේ ඇස්තමේන්තුගත ආදායම් ඉලක්ක ඉදිරිපත් කරන ලදි. අදාළ පළාත් බලධාරීන් සමඟ පවත්වන ලද සමාලෝචන රැස්වීම්වලදී (වගු අංක 06) ඉදිරිපත් කළ පළාත් ආදායම් ඉලක්ක සමාලෝචනය කර පළාත් ආදායමට බලපාන සාධකයන්හි වර්තමාන ප්‍රවණතාවයන් සැලකිල්ලට ගනිමින්, 2026 වර්ෂය සඳහා පළාත් ආදායම් ඉලක්ක තක්සේරු කරන ලදි. අවසානයේදී මුදල් කොමිෂන් සභාව විසින් එකඟතාවයන් ඇති කරගන්නා ලද ආදායම් ඉලක්ක හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් පළාත් වෙත මාරු කරන ලද ආදායම් කොටස සැලකිල්ලට ගනිමින් 2026 වසර සඳහා පළාත් ආදායම් තක්සේරු කරන ලදි.

VII. පුනරාවර්තන සහ ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා පළාත් සභා වෙත අක්මුදල් නිදහස් කිරීම් නිර්දේශ කිරීම

අංක 05/2023 දරන 2023.12.29 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභා, විශේෂ වියදම් ඒකක ලෙස නම් කර ඇති බැවින්, අයවැය ක්‍රියාකාරකම් සහ අනෙකුත් කාරණා සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්වරුන් විසින් පාර්ලිමේන්තුවට සෘජුව වගකිව යුතු වේ. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති අංක TO/BE4/01/07/06 දරන 2024/03/06 දිනැති ලිපියට අනුව, 2025 වර්ෂය සඳහා පළාත් සභාවලට අවශ්‍ය පුනරාවර්තන සහ ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වූ අක්මුදල් ඉල්ලීම් මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදි.

2025 වර්ෂය සඳහා පළාත් සභා වෙනුවෙන් මුදල් කොමිෂන් සභාව විසින් මුදල් නිර්දේශ කිරීම්, ජාතික අයවැයෙන් වෙන් කරනු ලබන ප්‍රතිපාදනයන්, අක්මුදල් නිදහස් කිරීම්, පළාත් ආදායම් හා පළාත් පුනරාවර්තන වියදම් ඇතුළත් සාරාංශයක් පහත දැක්වේ.

වගුව 08: පුනරාවර්තන අයවැය සඳහා පළාත් මූල්‍ය ප්‍රගතිය - 2025

(රු.මිලියන)

පළාත	මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය	සාමූහික ප්‍රදානය සඳහා වෙන් කිරීම (අමතර ප්‍රතිපාදන ඇතුළත්ව)	සාමූහික ප්‍රදානය සඳහා අක්මුදල් නිදහස් කිරීම	පළාත් විමධ්‍යගත ආදායම් එකතු කිරීම (මුද්දර ගාස්තු හා උසාවි දඩ හැර)	රජයේ ආදායම් මාරු කිරීම්	මුළු ලැබීම්	සත්‍ය පුනරාවර්තන වියදම
(1)	(2)	(3)	(4)	(5)	(6)	(7)= (4+5+6)	(8)
බස්නාහිර	101,431	76,734	75,082	13,837	11,999	100,918	93,562
මධ්‍යම	77,612	60,997	59,750	3,128	2,249	65,127	62,727
දකුණ	68,868	61,517	61,257	4,223	2,320	67,799	63,902
උතුර	51,126	43,565	43,354	1,518	1,233	46,105	44,622
වයඹ	68,667	58,283	57,690	6,096	2,296	66,083	61,682
උතුරු මැද	43,158	36,489	35,201	2,531	1,275	39,008	37,284
ඌව	48,081	42,142	41,688	1,842	1,215	44,746	42,779
සබරගමුව	59,340	50,607	46,995	2,712	1,321	51,028	50,415
නැගෙනහිර	59,801	51,303	49,490	1,529	1,261	52,280	50,988
එකතුව	**578,084**	**481,637**	**470,507**	**37,417**	**25,169**	**533,094**	**507,961**

2.1.3 පළාත් සංවර්ධන සැලසුම් කටයුතුවලට අදාලව පවත්වන ලද විශේෂ රැස්වීම්

I. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම සඳහා සබරගමුව පළාත් සභාව විසින් යොදා ගනු ලබන යාන්ත්‍රණය සමාලෝචන කිරීම

පළාත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා එම ව්‍යාපෘති/ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සඳහා සබරගමුව පළාත් සභාව විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාවලිය පිළිබඳව සාකච්ඡාවක් සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමියගේ ප්‍රධානත්වයෙන්, මුදල් කොමිෂන් සභාවේ ලේකම්, සබරගමුව පළාතේ ප්‍රධාන ලේකම් සහ පළාතේ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025 ජුනි 25 දින සබරගමුව පළාත් සභා පරිශ්‍රයේදී පවත්වන ලදි. රැස්වීමේ අරමුණ වූයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හා අධීක්ෂණයට බාධා වන පද්ධතියේ ඇති ගැටළු සහ අඩුපාඩු හඳුනා ගැනීම සහ එම ගැටළු අවම කිරීම සඳහා ගත හැකි පිළියම් හඳුනා ගැනීමයි.

II. බස්නාහිර පළාතේ "බුලත්සිංහල ප්‍රදේශය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම" යන විශේෂ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ යෝජනාව සමාලෝචනය කිරීම

බස්නාහිර පළාත් සභාව විසින් විශේෂ සංවර්ධන ව්‍යාපෘති යටතේ "යටිතල පහසුකම් සංවර්ධනය තුළින් බුලත්සිංහල සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම" යන මාතෘකාව යටතේ ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව සම්බන්ධයෙන් 2025 ජූලි 23 වන දින මුදල් කොමිෂන් සභාවේදී සාකච්ඡාවක් පැවැත්විණි. මුදල් කොමිෂන් සභාවේ ලේකම් සහ බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් මෙම රැස්වීමේ සම සභාපතිත්වය දැරූ අතර බස්නාහිර පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්), නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්), බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් සහ බස්නාහිර පළාත් සභාවේ සහ මුදල් කොමිෂන් සභාවේ අනෙකුත් අදාළ නිලධාරීන් මෙම සාකච්ඡාවට සහභාගී වූහ. සංචාරක කර්මාන්තයේ සංවර්ධනය සඳහා මෙම ක්‍රියාකාරකම්වල ශක්‍යතාව, ඵලදායීතාවය සහ දායකත්වය පිළිබඳව මෙම රැස්වීමේදී විස්තරාත්මකව සාකච්ඡා කරන ලදි. අනතුරුව, 2025 අගෝස්තු 10 වැනි දින, පළාත් බලධාරීන්, බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් සහ ප්‍රජාවේ නියෝජිතයන් සමඟ ව්‍යාපෘති යෝජනා අධ්‍යයනය කිරීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් පවත්වන ලදි.

III. 2025 වර්ෂයේ පළාත් සභා වාර්ෂික සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති සමාලෝචන රැස්වීම

2025 වර්ෂයට අදාළව සියලු පළාත් සභාවල වාර්ෂික සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීමේ රැස්වීමක් 2025 අගෝස්තු 12 වන දින මුදල් කොමිෂන් සභාවේදී පැවැත්විණි. මෙම රැස්වීමට මුදල් කොමිෂන් සභාවේ සභාපති, භාණ්ඩාගාර ලේකම්, මුදල් කොමිෂන් සභාවේ පත් කරන ලද සාමාජිකයින්, මුදල් කොමිෂන් සභාවේ ලේකම්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ සැලසුම් සහ මුදල් පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරුන් සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නියෝජිතයින් සහ මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන් සහභාගී වූහ.

2025 වර්ෂය සඳහා එක් එක් පළාතේ අදාළ වාර්ෂික සංවර්ධන සැලසුම්වලට අනුව පළාත් සංවර්ධන කටයුතුවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය සමාලෝචනය කිරීම මෙම රැස්වීමේ අරමුණ විය. වාර්ෂික සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභා මුහුණ දෙන ගැටළු සහ ඒ සඳහා යෝග්‍ය විසඳුම්ද, පළාත් සංවර්ධන කටයුතු කඩිනම් කිරීම සඳහා ගත යුතු සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳව ද මෙම රැස්වීමේදී සාකච්ඡා කරන ලදි.

IV. ගරු ආණ්ඩුකාරවරුන් සහ පළාත් ප්‍රධාන ලේකම්වරුන් සමඟ ප්‍රගති සමාලෝචනය

ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2025 සැප්තැම්බර් 11 දින පැවැත්වීමට නියමිතව තිබූ පළාත් ප්‍රගති සමාලෝචන රැස්වීමට පූර්වගාමීව 2025 පළාත් සංවර්ධන සැලසුම්වල ප්‍රගතිය සමාලෝචනය සහ සැලසුම් ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා බාධක වී ඇති ගැටළු හඳුනාගැනීම හා විසඳුම් ලබා දීම සඳහා පළාත් බලධාරීන් සමග රැස්වීමක් 2025 සැප්තැම්බර් 09 දින මාර්ගගත තාක්ෂණය ඔස්සේ පවත්වන ලදි. එම රැස්වීම මුදල් කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පළාත් ගරු ආණ්ඩුකාරවරුන්, මුදල් කොමිෂන් සභාවේ ලේකම්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, පළාත්වල නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (සැලසුම් හා මූල්‍ය) සහ මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

2.1.4 මුදල් කොමිෂන් සභාව නියෝජනය කරමින් මුදල් කොමිෂන් සභාවේ ලේකම්වරයා සම-සභාපතිත්වය/ සාමාජිකත්වය දරන ලද විශේෂ කමිටු සහ රැස්වීම්

(i) පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්යසාධනය මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රදාන ලබා දීම සඳහා වූ කමිටුව - සම-සභාපති

(ii) උසාවි දඩ මුදල් සහ ඉඩම් පැවරීම මත අයවන මුද්දර ගාස්තු පළාත් පාලන ආයතන වෙත ලැබීම විධිමත් කිරීම හා කඩිනම් කිරීම සඳහා පත් කරන ලද කමිටුව - සාමාජික

(iii) රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීමේ කමිටුව - සාමාජික

(iv) පාසල් දරුවන් සඳහා පෝෂ්‍යදායි ආහාර වේලක් ලබා දීමේ වැඩසටහන සඳහා වන ජාතික කමිටුව - සම-සභාපති

(v) පළාත් පාලන ආයතනවල වැටුප් ප්‍රතිපූර්ණ ප්‍රදාන අවම කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් යෝජනා කිරීම සඳහා වන කමිටුව - සම-සභාපති

(vi) ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන ඒකාබද්ධ සෞඛ්‍ය ආරක්ෂණය සහ පාලනය ශක්තිමත් කිරීම සඳහා වන විශ්ව සෞඛ්‍ය ආවරණ වැඩසටහනෙහි මෙහෙයුම් කමිටුව - සම-සභාපති

(vii) ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටුව - සාමාජික

(viii) ජාතික ඇගයීම් හා මෙහෙයුම් කමිටුවේ නිත්‍ය සාමාජික

(ix) විදේශ දූත කණ්ඩායම් සමඟ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සිදු කරනු ලබන විවිධ එකඟතා සාකච්ඡා සඳහා මුදල් කොමිෂන් සභාව නියෝජනය කරමින් සහභාගී වීම

2.1.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

අංක 02/2020 හා 2020.08.28 දිනැති සහ අංක 02/2025 හා 2025.05.30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයන්ට අනුකූලව සකසන ලද මුදල් කොමිෂන් සභාවේ 2024 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්යසාධන වාර්තාව, පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමියගේ අනුමැතිය ලබා ගැනීම පිණිස යොමු කිරීමට 2025 ජුනි 19 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කරන ලදි. ඒ අනුව, ගරු අග්‍රාමාත්‍යතුමියගේ අනුමැතිය ඇතිව එම වාර්තාව 2025 ජුනි 26 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. මුදල් කොමිෂන් සභාව පිළිබඳ මූලික හැඳින්වීම, 2024 වර්ෂයට අදාළව මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන්වල කාර්යසාධනය, මූල්‍ය ප්‍රගතිය සහ අනුකූලතා වාර්තාව මෙම වාර්තාවෙහි අන්තර්ගත මූලික කරුණු වේ. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති ආකෘතියට අනුව මෙම වාර්තාව සකස් කරන ලදි.

2.1.6 ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද නිර්දේශවලට අදාළ කරුණු

I. 2026 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික නිර්දේශ සකස් කර ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීම.

මුදල් කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවේ (4) (අ) අනුව්‍යවස්ථාවට අනුකූලව, 2026 වර්ෂය සඳහා වාර්ෂික නිර්දේශ සකස් කර 2025 ඔක්තෝබර් 31 වන දින ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදි. භාෂාත්‍රයෙන් සකස් කරන ලද මෙම සම්පූර්ණ වාර්තාව මුදල් කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ උඩුගත කොට ඇත. තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණින්, 2026 වර්ෂය වෙනුවෙන් පළාත් සඳහා තක්සේරු කරන ලද අරමුදල් අවශ්‍යතාවලට

අදාළ නිර්දේශ සහ වාර්ෂික අයවැයෙන් වෙන් කරනු ලබන අරමුදල් පළාත් අතර බෙදා හැරීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති පිළිබඳ මෙම වාර්තාවේ අන්තර්ගත කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවේ (3) අනුව්‍යවස්ථාවට අනුව, 2026 වර්ෂය සඳහා ජාතික අයවැයෙන් පළාත් සභාවල ප්‍රාග්ධන සහ පුනරාවර්තන අවශ්‍යතා සඳහා වෙන් කළ යුතු අරමුදල් සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව විසින් සිය නිර්දේශ රජයට ඉදිරිපත් කරන ලදි. පුරෝකථනය කරන ලද ආදායම ගැලපීමෙන් පසු, 2026 වසර සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ලෙස රු.මිලියන 114,647ක් සහ උපමාන පාදක ප්‍රදාන ලෙස රු. මිලියන 15,000 ක් නිර්දේශ කරන ලදි. ඒ අනුව, පුරෝකථනය කරන ලද ආදායම් ඉලක්ක ගැලපීමෙන් පසු, 2026 වර්ෂය සඳහා පළාත් සභා වෙනුවෙන් නිර්දේශිත මුළු ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රමාණය රු. මිලියන 129,647කි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවේ (5) අනුව්‍යවස්ථාවට අනුව, තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් අත් කර ගැනීම සඳහා සැලකිල්ලට ගත යුතු නිර්ණායකයන් සහ ළමා මන්දපෝෂණය සම්බන්ධයෙන් වන නිර්ණායකයක් ද ඇතුළත් කර ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව බහු විචල්‍ය සංඛ්‍යානමය ක්‍රමවේදයක් භාවිතා කරමින් ඉහත සඳහන් මුළු ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රමාණය පළාත් නවය අතර බෙදා දීම පිළිබඳව නිර්දේශ මෙම වාර්තාවෙහි ඇතුළත් වේ.

පුරෝකථනය කරනු ලැබූ පළාත් ආදායම් ගැළපීමෙන් අනතුරුව 2026 වර්ෂය සඳහා පළාත් සභාවල පුනරාවර්තන වියදම් වශයෙන් රු. මිලියන 692,416ක් මුදල් කොමිෂන් සභාව විසින් තක්සේරු කරන ලද බව නිර්දේශ වාර්තාවෙහි සඳහන් කරන ලදි. කෙසේ නමුත්, 2026-2030 මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව තුළ 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ නියමයන්ට අනුකූලව මහා භාණ්ඩාගාරය විසින් නිශ්චිතව දක්වා තිබූ වියදම් සීමාවන් අනුව, 2026 වර්ෂය සඳහා පළාත් සභා වෙත සාමූහික ප්‍රදාන වශයෙන් රු.මිලියන 533,000ක් වෙන් කෙරෙනු ඇතැයි විසර්ජන පනත් කෙටුම්පතට ඇතුළත් කර තිබුණි. මුදල් කොමිෂන් සභාව විසින් ගැඹුරු අධ්‍යයනයකින් පසුව තක්සේරු කරන ලද පුනරාවර්තන අවශ්‍යතා ප්‍රමාණය සහ විසර්ජන පනත් කෙටුම්පතෙහි ඇතුළත් කර තිබූ සාමූහික ප්‍රදාන අතර නිරීක්ෂණය කරන ලද පරතරය හේතුවෙන් 2026 වර්ෂය සඳහා පළාත් සභාවල පුනරාවර්තන අවශ්‍යතා සපුරා ගැනීමේදී මතු විය හැකි ගැටළු සම්බන්ධයෙන් නිර්දේශ වාර්තාවෙහි කරුණු ඉදිරිපත් කරන ලදි.

මීට අමතරව, රජයේ සමස්ත සංවර්ධන උපාය මාර්ගයට අනුපූරක වන සහ පළාත් සභාවල ඵලදායී කාර්යසාධනය සඳහා පහසුකම් සැලසිය හැකි ඇතැම් ප්‍රතිපත්තිමය නිර්දේශ ද ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද මෙම වාර්තාවෙහි ඇතුළත් කරන ලද අතර, ඒවා කෙටියෙන් පහත විස්තර කෙරේ.

(1) කල්වේලා ඇතිව සැලසුම් කිරීම තුළින් 2026 වසර තුළ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීම.

පළාත් සභා මෙන්ම රේඛීය අමාත්‍යාංශ විසින් ද 2025 වර්ෂය සඳහා රජය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් වැය කර තිබූයේ සාපේක්ෂව අඩු ප්‍රතිශතයකි. 2025 වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත 2025.03.21 දින පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමෙන් පසුව, ව්‍යාපෘති සැලසුම් කිරීම එයට මූලික හේතුවක් විය.

කෙසේ වෙතත්, 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 15 වන වගන්තියට අනුව 2026 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය විසින් තීරණය කර ඇති අනුගම්‍ය වියදම් සීමාවන් (binding ceilings) අනුව, විසර්ජන පනත් කෙටුම්පතේ පළාත් සභා වෙත අනුගම්‍ය ප්‍රතිපාදන ලෙස වෙන්කර තිබූ මුළු ප්‍රතිපාදනය කොමිෂන් සභාව විසින් පළාත් සභා අතර වෙන් කර දෙන ලදි. ඒ අනුව, 2026 වර්ෂය සඳහා වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා වූ මාර්ගෝපදේශ 2025.10.07 දිනැතිව පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත යොමු කරන ලද අතර, වාර්ෂික සංවර්ධන සැලසුම් 2025.11.15 දිනට පෙර ඉදිරිපත් කිරීමටත්, අදාළ සැලසුම් සමාලෝචනය කොට 2025.12.31 දින වන විට මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා දීමටත් සැලසුම් කර තිබුණි.

රේඛිය අමාත්‍යාංශ සඳහා ද ඉහත පරිදි 2026 විසර්ජන පනත් කෙටුම්පතට ඇතුළත්ව ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් සැලකිල්ලට ගනිමින් කල්වේලා ඇතුව සැලසුම්කරණ ක්‍රියාවලිය සිදු කරන්නේ නම්, අදාළ අමාත්‍යාංශවල ව්‍යාපෘති ද පළාත් සභා සංවර්ධන සැලසුම්වලට මැනවින් ඒකාබද්ධ කර ගනිමින් ද්වීකරණය වළක්වාගෙන වඩාත් කාර්යක්ෂම ලෙස ප්‍රතිපාදන උපයෝජනය කිරීමට ඉඩ සැලසෙනු ඇති බව කොමිෂන් සභාව විසින් පෙන්වා දෙන ලදි.

(2) ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ව්‍යවසාය සංවර්ධනයේ දී ජාතික මට්ටමෙන් හා පළාත් මට්ටමෙන් ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් සමගාමී අයුරින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය

ජීවනෝපාය සංවර්ධනය, නව තාක්ෂණය හඳුන්වා දීම වැනි අරමුණු ඉටු කර ගැනීමේ අපේක්ෂාවෙන් කෘෂිකර්ම, සත්ත්ව පාලනය, ධීවර, කුඩා කර්මාන්ත, ග්‍රාමීය සංවර්ධන, සමුපකාර වැනි විෂයයන්ට අදාළව පළාත් සභා විසින් ක්ෂුද්‍ර හා කුඩා පරිමාණයේ ව්‍යාපෘති බහුතරයක්ම ක්‍රියාත්මක කෙරෙනුයේ එකී කටයුත්තෙහි පිරිවැයෙන් 50% ක් (ආපසු අය නොකරන) ආධාරයක් ලෙස පළාත් සභාවෙන් ලබාදීමේත් ඉතිරි 50% ප්‍රතිලාභියා විසින් දැරීමේත් පදනම මත ක්‍රියාත්මක වන වැඩසටහන් ලෙස ය.

මෙබඳු වැඩසටහන් ඒකාකාරී ලෙස සෑම අවුරුද්දකම ක්‍රියාත්මක කිරීමේ ඵලදායීතාවය පිළිබඳව පළාත් සභාවන්හි වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීමේදී ගැටළු රාශියක් හඳුනාගන්නා ලදි. එහිදී, ආධාරය ලබා ගැනීමේ අරමුණින්ම ඊට සම්බන්ධ වුවත් බොහෝ දෙනෙකුට සැබෑ අවශ්‍යතාවයක් හෝ කැපවීමක් නොතිබූ බව මෙන්ම ව්‍යාපාරික සැලැස්මක් හා හැකියාවක් නොමැති වීම, ව්‍යාපෘති/ක්‍රියාකාරකම් අසාර්ථක වන අවස්ථාවලදී ඊට ආයෝජනය කර තිබූ පෞද්ගලික මුදල් ද අපතේ යාම, රජයේ සහනාධාරය වියදමක් ලෙස ගණන් නොබැලීමෙන් අලාභදායී ව්‍යාපෘති ද ලාභදායී ලෙස වරදවා හඳුනා ගැනීම, ව්‍යවසායකයන් ලෙස විභවතාවය තිබුණ ද පෞද්ගලිකව යෙදවිය යුතු ප්‍රාග්ධනය සපයා ගැනීමට අපහසු අවස්ථාවන්හිදී තම කටයුතු ලාභදායී නොවන පරිමාණයකට සීමා කිරීමට සිදු වීම වැනි තත්ත්වයන් උද්ගත වී ඇති බව අනාවරණය විය.

එබැවින්, ප්‍රතිලාභී දායකත්ව වැඩපිළිවෙළ වෙනුවට පොළී රහිත/සහන පොළී මත ණයක් වශයෙන් රජයේ ආධාරය ප්‍රතිලාභීන් වෙත ලබාදීමේ යෝග්‍යතාවය පිළිබඳව මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභා බලධාරීන් දැනුම්වත් කරන ලදි. ඒ අනුව, සෑම පළාත් සභාවක් විසින්ම පාහේ 2025 වර්ෂයේ දී ඍජු ප්‍රදානයන් වෙනුවට පොළී රහිත/සහනශීලී පොළිය මත දෙනු ලබන ණය ක්‍රම ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. එසේ වුවද, රේඛීය අමාත්‍යාංශ හා ආයතන විසින් එකී විෂයයන්ටම අදාළව ආපසු අය නොකරන පදනම මත 50% මූල්‍යාධාර ලබාදීම තුළින් පළාත් සභා මගින් මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමට බාධාවන් මතු වී ඇත.

එබැවින්, ජීවනෝපාය සංවර්ධනය සඳහා ක්ෂුද්‍ර හා කුඩා පරිමාණයේ ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කෙරෙන ආයෝජන මගින් උපරිම ඵල ලබා ගැනීම තුළින් තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා ආපසු අය නොකරන ආධාර පහත සඳහන් කාණ්ඩයන්ට පමණක් ක්‍රියාත්මක කිරීමටත්, එබඳු ක්‍රියාකාරකම් සඳහා අනෙකුත් ප්‍රතිලාභීන් වෙත පොළී රහිත/සහනශීලී ණය ක්‍රමයක් යටතේ මූල්‍ය පහසුකම් ලබාදීම යෝග්‍ය බවටත් මුදල් කොමිෂන් සභාව විසින් යෝජනා කරන ලදි.

(i) විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්

(ii) පරිවාසගතව සිට සමාජගත වන පුද්ගලයින්

(iii) දීර්ඝකාලීනව රෝග පීඩා ආදියෙන් පීඩා විඳින පවුල් සඳහා ජීවනෝපාය සැලසීම

(iv) තනිව දරුවන් හදාගන්නා මව්වරුන් (Single Mothers)

(v) විවිධ ක්ෂේත්‍ර යටතේ වෘත්තීය පුහුණුව ලැබූ එම වෘත්තිය පුහුණුව තුළින් පළමුවරට ස්වයංරැකියා සඳහා යොමුවන තරුණ තරුණියන් (ආරම්භක ප්‍රාග්ධනය වෙනුවෙන්)

ඒ අනුව, මෙවැනි වැඩසටහන්/ව්‍යාපෘතිවලට ආධාර ලබාදීමේ දී ජාතික මට්ටමේ හා පළාත් මට්ටමේ ආයතන විසින් ඒකාකාරී ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම යෝග්‍ය බවට නිර්දේශ කරන ලදි.

(3) විදේශාධාර මත ක්‍රියාත්මක වන විමධ්‍යගත විෂයයන්ට අදාළ ව්‍යාපෘති වඩාත් උචිත පරිදි සැලසුම් කිරීම

පළාත් සභා විෂයයන්ට අදාළ විදේශාධාර ව්‍යාපෘති/ ව්‍යාපෘති සංරචක බොහෝ විට මධ්‍යගත ලෙස සැලසුම් කර රේඛීය අමාත්‍යාංශ විසින්ම ක්‍රියාත්මක කරන බව නිරීක්ෂණය වන අතර, එබඳු ව්‍යාපෘති ක්‍රියාකාරකම් පළාත් සභාව විසින් හඳුනාගත් ප්‍රමුඛතා නොවීම සහ පළාත් සභාවේ වාර්ෂික සංවර්ධන සැලස්මට ඇතුළත් නොවීම බහුලව දක්නට ලැබේ.

එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ධාරිතාවය පළාත් සභා සතුව තිබුණ ද, රේඛීය අමාත්‍යාංශ විසින් පිහිටුවා ගත් ව්‍යාපෘති කාර්යාල මගින් පළාත් සභා නිලධාරීන්ට ද අමතර දීමනා ගෙවමින් ඉහළ පරිපාලන වියදමක් දරමින් ක්‍රියාත්මක කිරීම සිදු වේ. එම ව්‍යාපෘති නිමාවීමෙන් පසුව එමගින් නිමවූ වත්කම්වල වගකීම හෝ එම ව්‍යාපෘතිවලට අදාළ සේවා සැපයීමේ වගකීම නිසි පරිදි භාර ගැනීමට ද කෙනෙකු නොමැති වේ. දේශීය අරමුදල්වලින් අඩු පිරිවැයක් යටතේ ඉදිකිරීම් කළ හැකි වුවද, ඇතැම් විදේශාධාර ව්‍යාපෘති යටතේ ඉහළ පිරිවැයක් දරමින් සිදු කල ඉදිකිරීම් බොහෝමයක් ප්‍රයෝජනයට ගත නොහැකි හෝ ඌණ උපයෝජන තත්ත්වයට පත්ව ඇත.

එබැවින්, පළාත් සභා විෂයයන්ට අදාළ වන විදේශාධාර ව්‍යාපෘති සැලසුම් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිර්දේශ මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇත.

(i) පළාත් සභාවල පූර්ණ සහභාගිත්වය ලබා ගැනීම හා සංකූලතා අවම වන මූල්‍ය ප්‍රවාහ ක්‍රමවේදයක් යොදා ගැනීම,

(ii) දේශීය අරමුදල් යොදා ගනිමින් අඩු පිරිවැයක් යටතේ ඉදි කළ හැකි කුඩා පරිමාණයේ ව්‍යාපෘති/ක්‍රියාකාරකම් විදේශාධාර ව්‍යාපෘතිවලට ඇතුළත් නොකිරීම,

(iii) මූල්‍යාධාර ඉඳුරාම ව්‍යාපෘතියට යොමු වන ක්‍රමවේදය (Project Support mode) වෙනුවට හැකිතාක් දුරට සැලසුම්ගත ක්‍රියාකාරකම් වෙනුවෙන් විදේශාධාර හිලව් කිරීමේ ක්‍රමවේදය (Budget Support mode) ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම,

(iv) පළාත් සංරචකයන්ට අදාළ ඉදිකිරීම් හා මිළදී ගැනීම් සඳහා (අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ කරගෙන යාමට) පළාත් සභාවන් හට ඉඩ දීම.

(4) ග්‍රාමීය ප්‍රදේශවල සහ වතු වැවිලි ප්‍රදේශවල පිහිටි පාසල් ප්‍රතිසංවිධානය නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම

ග්‍රාමීය හා වතු වැවිලි ප්‍රදේශවල පිහිටි අඩු සිසුන් සංඛ්‍යාවක් සිටින පාසල්වල ඉගෙනුම ලබන ළමුන් හට ගුණාත්මක අධ්‍යාපනයක් නොලැබෙන බැවින්, මනා අධ්‍යයනයකින් පසුව එකී පාසල් ඒවාට ආසන්නයේ පිහිටි සාපේක්ෂව පහසුකම් වැඩි පාසල් සමග ඒකාබද්ධ කිරීමේ යෝග්‍යතාව පිළිබඳව මෙම කොමිෂන් සභාව විසින් 2024 වසර වෙනුවෙන් සහ 2025 වසර වෙනුවෙන් ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද නිර්දේශවලදී අවධාරණය කරන ලදි.

පළාත් සභාවල තොරතුරුවලට අනුව දිවයින පුරා සිසුන් 50 ට අඩු පාසල් 1,541 ක් ඇති අතර එම පාසල්වල ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව 45,659ක් ද ඒවායේ සේවය කරන ගුරුභවතුන් සංඛ්‍යාව 8,712ක් ද වේ. ඒවායින් ඇතැම් පාසල්වල පිහිටීම අනුව ප්‍රවාහන දුෂ්කරතා නොමැති, වන අලි උවදුර නොමැති, පාලම් රහිත ගංගා හෝ ගමන් කිරීමට අපහසු භූ විෂමතාවයන් නොමැති ප්‍රදේශයන්හි තවදුරටත් මෙම පාසල් පවත්වාගෙන යාම නිරීක්ෂණය වේ.

තොරතුරුවලට අනුව, එවැනි පාසල් 24 ක් කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර, එම පාසල්වල සිසුන් 718 ක් හා ගුරුවරුන් 147ක් ද වෙති. එම පාසල්වලිනුත් කොළඹ කලාපයේ සිසුන් 50ට අඩු පාසලේ සිට පහසුකම් සහිත පාසල දක්වා වන දුර සාමාන්‍යයෙන් කිලෝමීටර 1කට අඩු ය. ඒ අනුව, කොළඹ දිස්ත්‍රික්කයේ එබඳු පාසල් බොහොමයක්ම සිසුන්ට අපහසුතාවක් ඇති නොවන පරිදි ළඟම ඇති පාසලට ඒකාබද්ධ කළ හැකි අතර ඔවුන් අනුයුක්ත කෙරෙන පාසල දක්වා ඇති දුර අනුව එම සිසුන් හට ප්‍රවාහන දීමනාවක් ලබා දීම සුදුසු වේ.

ඉහත සඳහන් අන්දමේ දිරි දීමනාවන් ලබා දෙමින් මෙම ව්‍යාපෘතිය නියමු ව්‍යාපෘතියක් ලෙස කොළඹ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට සුදුසු බවටත්, එහිදී හඳුනාගනු ලබන ප්‍රායෝගික අත්දැකීම් ද පදනම් කරගනිමින් මෙම වැඩ පිළිවෙල අනෙකුත් පළාත් තුළ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි වනු ඇති බවටත් මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදි.

(5) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පසු විපරම් කිරීමේදී මහජන සහභාගීත්වය ලබා ගැනීම.

රජයේ අරමුදල් යොදවමින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති අපේක්ෂිත ප්‍රමිතියෙන් යුතුව නිම කිරීම සඳහා නිරන්තර පසු විපරමක් හා අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක විය යුතුය. කෙසේ වෙතත්, පවතින නිලධාරී හිඟය හා පහසුකම් හිඟය මෙන්ම, ව්‍යාපෘති සංඛ්‍යාව ඉතා විශාල වීම ආදී හේතු නිසා එම නිලධාරීන්ට සෑම ව්‍යාපෘතියක්ම එසේ සමීපව අධීක්ෂණය කිරීම ප්‍රායෝගිකව අපහසු වී ඇත.

ඊට විකල්පයක් ලෙස, අදාළ නිලධාරීන් විසින් එකී ව්‍යාපෘති අධීක්ෂණය කිරීමට අතිරේකව එක් එක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන ප්‍රදේශයේ මහජනතාවට මෙන්ම මහජන නියෝජිතයින්ට අදාළ ඉදිකිරීම් කටයුතු ගැන විමසිලිමත්ව සිටීමට අවස්ථාව සලසාදීම සුදුසු බව නිරීක්ෂණය විය. ඒ අනුව, පළාත් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘතිවල ප්‍රමාණ පත්‍ර (BOQ) මහජනතාවට පහසුවෙන් තේරුම් ගත හැකි පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ප්‍රදේශ ආශ්‍රිතව ප්‍රදර්ශනය කරන ලෙසත්, යම් තොරතුරක් ඉල්ලා සිටින අවස්ථාවක එම තොරතුරු පහත දැක්වෙන පරිදි ලබා දෙන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලෙසත් මුදල් කොමිෂන් සභාව විසින් පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත දන්වා යවා ඇත.

i. අවශ්‍ය අයෙකුට අදාළ ප්‍රමාණ පත්‍ර වැඩබිම තුළ දී පරීක්ෂා කර බැලීමට ඉඩ දීම.

ii. අවශ්‍ය අයෙකුට එම ප්‍රමාණ පත්‍රවල ඡායාරූප ලබා ගැනීමට ඉඩ ලබා දීම.

iii. පළාත් සභාවේ නිශ්චිත වෙබ් අඩවියක එම ප්‍රමාණ පත්‍ර ප්‍රදර්ශනය කිරීම හා ප්‍රමාණ පත්‍ර ලබා ගත හැකි වෙබ් අඩවියට පිවිසෙන අයුරු ලැමිනේට් කරන ලද පත්‍රිකාවක් වැඩ බිමට පිවිසෙන ස්ථානයේ ප්‍රදර්ශනය කිරීම මෙන්ම අවශ්‍ය ඕනෑම අවස්ථාවක ප්‍රමාණ පත්‍ර ඉල්ලා සිටින අයෙකුට එම ප්‍රමාණ පත්‍ර ලබාදීමට වැඩපිළිවෙළක් ද හඳුන්වා දීම.

මෙම උපදෙස් සෑම පළාතකම ක්‍රියාත්මක වන අතර, මාධ්‍යවල පළවූ ප්‍රතිචාර අනුව එය මහජනතාවගේ ඇගයීමට ලක්වන බව නිරීක්ෂණය වී ඇත. එබැවින්, රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති/ක්‍රියාකාරකම් පසු විපරම් කිරීමේදී මහජන සහභාගීත්වය ලබා ගැනීම සඳහා පළාත් සභා විසින් සිදු කරනු ලබන ඉහත ක්‍රමවේදය සැළකිල්ලට ගනිමින්, ප්‍රමාණ පත්‍ර හා ඉදිකිරීමට අදාළ මූලික තොරතුරු මහජනතාවට ලබාගැනීමට පහසුකම් සැලසිය යුතු බවට සියලුම රාජ්‍ය ආයතන වෙත උපදෙස් ලබා දීම සුදුසු බවට මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදි.

(6) පරිවාසගත දරුවන් රැකබලා ගැනීමේ කාර්යමණ්ඩල අවශ්‍යතාව

දෙමව්පිය රැකවරණය නොලබන අනාථ ළමුන් මෙන්ම ළමා වරදකරුවන්ද රැක බලා ගැනීම පළාත් සභාව යටතේ ගැනෙන පරිවාස දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන විවිධ රැකවරණ මධ්‍යස්ථානවලින් ඉටු වේ. මෙම කොමිෂන් සභාව විසින් පසුගිය වසරේ ඉදිරිපත් කළ නිර්දේශ වාර්තාවේ දීර්ඝ වශයෙන් ඉදිරිපත් කරන ලද කරුණු සැලකිල්ලට ගනිමින් එකී ආයතනවලට අවශ්‍ය භෞතික පහසුකම් ලබා දීමත්, ප්‍රවාහන

පහසුකම් සැලසීම සම්බන්ධයෙනුත්, එකී ළමුන්ගේ වයස සම්පූර්ණ වීම මත සමාජගත කිරීමට පහසුකම් සැලසීම සම්බන්ධයෙනුත් 2025 වර්ෂය සඳහා වූ අයවැය යෝජනා මගින් සහන රාශියක් සලසා තිබුණි.

එසේ වුවද, පළාත් පරිවාස දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යභාරය ඉටු කිරීමට ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් නොමැති වීම මත පරිවාසගතව සිටින දරුවන්ගේ සුභසාධනය විශාල ලෙස පිරිහීමකට ලක්වී ඇත. දරුවන්ගේ සෞඛ්‍යාරක්ෂිත බව, පෝෂණය, රෝගී දරුවන් රැකබලා ගැනීම, අධ්‍යාපන හා පුහුණුවීම් කටයුතු අඩාල වීම මෙන්ම ඔවුන්ට නිසි ආරක්ෂාව සැපයීමට අපහසුවීම වැනි අසතුටුදායක තත්ත්වයන් එමගින් උද්ගත වී ඇත.

මේ තත්ත්වය යටතේ පරිවාස දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය සේවක සංඛ්‍යාව ලබා දීමට විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු බැවින්, දැනට කරගෙන යනු ලබන කාර්යමණ්ඩල සමාලෝචනය අවසන් වන තෙක් නොසිට පළාත් පරිවාස දෙපාර්තමේන්තු සඳහා අවශ්‍ය තනතුරු ඇති කිරීමටත් පුරප්පාඩු වී ඇති තනතුරු පිරවීමටත් අදාළ බලධාරීන්ට උපදෙස් දීම සුදුසු යැයි මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදි.

II. 2026 වර්ෂය සඳහා වන නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

2026 වර්ෂය සඳහා වන මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා විසින් 2025 නොවැම්බර් 16 වන දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි. ඒ අනුව, මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ සඳහා 2025 නොවැම්බර් 24 වන දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසුව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අතර, එය 2025 දෙසැම්බර් 19 වන දින පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත.

2.1.7 කාර්තුමය විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා අභ්‍යන්තර විගණන අංශයේ සමස්ත කාර්යසාධනය පහත පරිදි වේ.

1. මුදල් රෙගුලාසි 134(2) ට අනුව 2026 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම 2025.12.22 දින විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී අනුමත කර කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට හා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම.
2. කළමනාකරණ චක්‍රලේඛ DMA /1 - 2019 ට අනුව 2025 වසරේ ජනවාරි 31 දිනට පෙර මූලික වාර්තාව සකස් කර ආයතන ප්‍රධානියාට ඉදිරිපත් කර තිබීම.
3. සියලුම අභ්‍යන්තර විගණන වාර්තා සඳහා පිළිතුරු ලබා ගැනීම.
4. 2018 අංක 19 දරන විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.
5. මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම.
6. සෑම කාර්තුවක් අවසානයේදීම ඇගයීම් වාර්තාව ඉදිරිපත් කර තිබීම.
7. වසරේ කාර්තු හතර තුළ අභ්‍යන්තර විගණන රැස්වීම් පවත්වා තිබීම.
    - පළමු කාර්තුව 2025.03.21
    - දෙවන කාර්තුව 2025.06.27
    - තුන්වන කාර්තුව 2025.09.17
    - හතරවන කාර්තුව 2025.12.22

2.2 මුදල් කොමිෂන් සභාව ළඟාකර ගත් විශේෂයෙන් සඳහන් කළ යුතු කාර්යසාධනයන්

I. කල්වේලා ඇතිව සැලසුම් කිරීම තුළින් 2026 වසර තුළ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීම - 2026 වර්ෂයට අදාළ පළාත්වල වාර්ෂික සංවර්ධන සැලසුම් 2025.12.31 දිනට අනුමත කිරීම.

සම්ප්‍රදායිකව, 2025 වර්ෂය දක්වාම මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභාවල වාර්ෂික සංවර්ධන සැලසුම් (ADP) සකස් කිරීම සඳහා වන මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබුවේ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීමෙන් පසුවයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීමේ රැස්වීම් සහ ඒ සඳහා එකඟතාවය ලබා දීමේ ක්‍රියාවලිය සාමාන්‍යයෙන් අදාළ වර්ෂයේ පළමු කාර්තුව තුළදී නිම කරන ලද අතර, එය පළාත් මට්ටමින් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමට හේතු විය.

මෙම ගැටලුවට විසඳුමක් ලෙස මුදල් කොමිෂන් සභාව විසින් 2026 වර්ෂය සඳහා වන පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීමේ මාර්ගෝපදේශ, විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීමට පෙර, එනම් 2025 ඔක්තෝබර් මාසයේදීම ප්‍රධාන ලේකම්වරුන් වෙත නිකුත් කරන ලදි. මෙහි අරමුණ වූයේ පළාත් සැලසුම්කරණ ක්‍රියාවලිය කඩිනම් කිරීම සහ පළාත් සභාවලට පෙර වර්ෂවලට වඩා කලින් තම වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කර ඒවා එකඟතාව ලබා ගැනීම සඳහා 2025 නොවැම්බර් මැද භාගය වන විට මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට සහාය වීමයි.

2025.09.17 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද ඉදිරි වර්ෂය (2026) සඳහා වන විසර්ජන පනත් කෙටුම්පතෙහි පළාත් සභා ඇතුළු සියලුම වියදම් ඒකක සඳහා වන ඇස්තමේන්තුගත අයවැය ප්‍රතිපාදන සඳහන් කර තිබුණි. 2026 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පතෙහි දක්වා ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන්, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 15 වැනි වගන්තියට අනුව නියම කර ඇති "උපරිම සීමාව" (binding ceiling) මත පදනම් වූ බැවින් පෙර වර්ෂවල මෙන් නොව මෙවර වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මෙම ප්‍රතිපාදන ප්‍රමාණයන් වඩාත් නිශ්චිතභාවයකින් යුතුව දැනුම් දීමට හැකි විය.

ඉහත සඳහන් කළ තත්ත්වය සැලකිල්ලට ගනිමින් සහ එම විසර්ජන පනත් කෙටුම්පතෙහි ඇති තොරතුරු මෙන්ම මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් තොරතුරු මත පදනම්ව, 2026 වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා 2026 වර්ෂයට අදාළව වාර්ෂික අයවැයෙන් ලැබේ යැයි නිශ්චය කර ගනු ලැබූ ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණයන් (PSDG සහ CBG) ප්‍රධාන ලේකම්වරුන් වෙත දැනුම් දෙන ලදි.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, සියලුම පළාත් සභාවලට 2026 වර්ෂය සඳහා වන වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කර 2025 නොවැම්බර් අවසානය වන විට මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට හැකි විය. ඒ අනුව, වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචන රැස්වීම් සාර්ථකව නිම කර 2025 දෙසැම්බර් මාසය තුළදීම එනම්, 2026 මූල්‍ය වර්ෂය ආරම්භ වීමට පෙර සියලුම පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සඳහා එකඟතාව ලබා දීමට මුදල් කොමිෂන් සභාවට හැකි විය. මෙය සැලසුම්කරණ සහ එකඟතාවය ලබා දීමේ ක්‍රියාවලියේ කැපී පෙනෙන ප්‍රගතියක් සනිටුහන් කළ අතර, 2026 වර්ෂයේදී පළාත් සංවර්ධන වැඩසටහන් නියමිත වේලාවට ක්‍රියාත්මක කිරීමට මහෝපකාරී විය.

II. මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභා හා සම්බන්ධව ගනු ලැබූ වැදගත් ප්‍රතිපත්තිමය තීරණ

2025 වර්ෂය තුළ මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද කොමිෂන් සභා රැස්වීම්වලදී ගන්නා ලද වැදගත් ප්‍රතිපත්තිමය තීරණ පහත දැක්වේ.

- 2025 වර්ෂයේ මුල් මාස 04ක කාලයක් සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අතුරු සම්මත ගිණුම අනුව, පළාත් සභා වෙත වෙන් කරන ලද අරමුදල් පුනරාවර්තන හා ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා පළාත් නවය අතර බෙදා වෙන් කර දීම සඳහා අනුමැතිය ලබා දීම.

- 2025 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන අරමුදල් භාවිතයෙන් පළාත් සංවර්ධන සැලසුම් සකස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශය, නඩත්තු ක්‍රියාකාරකම් සඳහා මාර්ගෝපදේශය, පාසල් පෝෂණ වැඩසටහන සඳහා මාර්ගෝපදේශය සහ පළාත් නිශ්චිත සංවර්ධන අරමුදල් භාවිතයෙන් සිදු කරනු ලබන විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ මාර්ගෝපදේශය පළාත් සභා වෙත නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දීම.

- 2025 වාර්ෂික අයවැයෙන් පළාත් සභා සඳහා පුනරාවර්තන අරමුදල් හා ප්‍රාග්ධන අරමුදල් ප්‍රමාණයන් වෙන් කර දීම.

- 2026 වර්ෂය සඳහා පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා පළාත් සභා වෙත මාර්ගෝපදේශ නිකුත් කිරීම.

- 2026 වර්ෂය සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා පළාත් සභා වෙත මාර්ගෝපදේශ නිකුත් කිරීම.

- 2025 වර්ෂයට අදාළ වාර්ෂික සංවර්ධන සැලැස්ම අදාළ පාර්ශව සමග සමාලෝචනය කිරීමේදී එළැඹෙන ලද තීරණ සහ යෝජිත සංශෝධනයන්ට යටත්ව එම සංවර්ධන සැලසුම් සඳහා මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය පළාත් සභා වෙත දන්වා යැවීමට අනුමැතිය ලබා දීම.

- 2025 වර්ෂයට අදාළ පළාත්වල නඩත්තු ක්‍රියාකාරකම් සැලසුම් සඳහා මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය පළාත් සභා වෙත දන්වා යැවීමට අනුමැතිය ලබා දීම.

- 2026 වර්ෂය සඳහා පළාත් අතර අරමුදල් වෙන් කර දීමට පදනම් කර ගැනීම සඳහා සකස් කරන ලද සූත්‍රය අනුව, පළාත් අතර අරමුදල් බෙදා දිය යුතු ප්‍රතිශත සඳහා අනුමැතිය ලබා දීම.

- ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර මත ක්‍රියාත්මක වීමට නියමිත "ඒකාබද්ධ සෞඛ්‍ය ආරක්ෂණය සහ පාලනය ශක්තිමත් කිරීම සඳහා වන විශ්ව සෞඛ්‍ය ආවරණ වැඩසටහන 2025-2030" යටතේ පළාත් අතර අරමුදල් බෙදා වෙන් කිරීම සඳහා සකස් කරන ලද සූත්‍රය අනුව අදාළ ප්‍රතිශත භාවිතා කර පළාත් අතර අරමුදල් බෙදා දීම සඳහා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත නිර්දේශ කිරීමට අනුමැතිය ලබා දීම.

- පළාත් සභා විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘතිවල වැඩබිම් ආශ්‍රිතව මහජනතාවට පහසුවෙන් අවබෝධ කර ගත හැකි අයුරින් ප්‍රමාණ පත්‍ර ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන මෙන් පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්ට දන්වා යැවීම සඳහා අනුමැතිය ලබා දීම.

- Clean Sri Lanka වැඩසටහන යටතේ පළාත් සභා විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම, සහ ඒ අනුව පළාත් සභා විසින් සකස් කරන ලද ක්‍රියාත්මක සැලසුම් සඳහා එකඟතාවය ලබා දීම.
- 2026 වර්ෂය සඳහා තක්සේරු කරන ලද පළාත් ප්‍රාග්ධන අවශ්‍යතාවය මහා භාණ්ඩාගාරය වෙත නිර්දේශ කර යැවීම සඳහා අනුමැතිය ලබා දීම.

- 2026 වර්ෂය සඳහා තක්සේරු කරන ලද පළාත් පුනරාවර්තන අවශ්‍යතාවය මහා භාණ්ඩාගාරය වෙත නිර්දේශ කර යැවීම සඳහා අනුමැතිය ලබා දීම.

- ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා ආපසු අය නොකරනු ලබන පදනම මත රජය විසින් ලබා දෙන 50% දායකත්ව ආධාර මුදල වෙනුවට පොලී රහිත හෝ සහන පොලී මත ලබා දෙන ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන මෙන් පළාත් සභා වෙත දන්වා යැවීම සඳහා අනුමැතිය ලබා දීම.

- 2026 වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීමට අනුමැතිය ලබා දීම.

III. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (4) යටතේ මුදල් කොමිෂන් සභාව විසින් 2026 වර්ෂය සඳහා ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද නිර්දේශ සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමාගේ නිරීක්ෂණ සහ අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දෙන ලද අනුමැතිය හා විශේෂ උපදෙස්

2026 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශවලට අදාළව ගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබූ 2025.11.16 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි අඩංගු ගරු ජනාධිපතිතුමාගේ නිරීක්ෂණවලින් පෙනී යන්නේ, රටේ සමස්ත සංවර්ධන උපාය මාර්ගය තුළ මුදල් කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශ හොඳින් සලකා බලනු ඇති බවයි. ගරු ජනාධිපතිතුමා විසින් කරන ලද නිරීක්ෂණ කෙටියෙන් පහත පරිදි වේ;

* අධ්‍යාපන හා සෞඛ්‍ය අංශවල රාජ්‍ය සේවකයන්ගේ වැඩිම පිරිසක් පළාත් සභා ව්‍යුහය යටතේ සිටීම හේතුවෙන් සාපේක්ෂව වැඩි සේවක සංඛ්‍යාවක් සිටින පසුබිමක පළාත් සභා සඳහා වෙන් කර දී ඇති පුනරාවර්තන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමේ ගැටළුව පිළිබඳව කොමිෂන් සභාව විසින් සඳහන් කර ඇති කරුණු පිළිබඳව ගරු ජනාධිපතිතුමන්ගේ අවධානය යොමු වී ඇති බව.

* 2026 වර්ෂය සඳහා ජාතික අයවැයෙන් පළාත් සභා සඳහා වෙන් කෙරෙන ප්‍රාග්ධන ප්‍රදානයන්, ආර්ථික හා සමාජමය වශයෙන් පසුගාමී පළාත්වලට වාසි සහගත ලෙස සම්පත් බෙදී යන අයුරින් තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් අරමුණු කර ගනිමින් පළාත් සභා අතර වෙන් කර දිය යුතු ආකාරය පිළිබඳව සූත්‍රයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ(4) (අ) අනුව්‍යවස්ථාවට අනුකූල වෙමින් කොමිෂන් සභාව විසින් යොදා ගෙන ඇති නමුත්, පළාත්වලට බෙදෙන සම්පත් ප්‍රමාණයට වඩා වැඩි සම්පත් ප්‍රමාණයක් එබඳු සූත්‍රයක් යොදා ගැනීමකින් තොරව රේඛීය අමාත්‍යාංශ විසින් ලබා දෙන පසුබිමක එම සූත්‍රයෙන් ලැබෙන ප්‍රයෝජනය සීමිත බව.

* පෙර වර්ෂවලදී මෙන් නොව, 2026 වර්ෂය සඳහා අයවැය සම්මතවීමට පූර්වයෙන්ම රජය විසින් තීරණය කර ඇති ප්‍රාග්ධන ප්‍රතිපාදන සීමාවන් යොදා ගනිමින් සංවර්ධන සැලසුම් සකස් කිරීමට පළාත් සභා වෙත උපදෙස් ලබා දී තිබීම සහ අදාළ සැලසුම් සඳහා 2025.12.31 දිනට පෙර කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇති බැවින්, එබඳු සැලසුම් ක්‍රියාවලියක් රේඛීය අමාත්‍යාංශ විසින් ද අනුගමනය කරන්නේ නම්, සංවර්ධන සැලසුම්වල ක්‍රියාකාරකම් ද්විකරණය වීමකින් තොරව ක්‍රියාත්මක කිරීමට හැකි වීම සහ එමගින් වර්ෂයට අදාළ ප්‍රතිපාදනවලින් ඉහළ ප්‍රතිශතයක් උපයෝජනය කිරීමට හැකි වන බැවින්, රේඛීය අමාත්‍යාංශ විසින් ද ඒ පිළිබඳව අවධානය යොමු කිරීම සුදුසු බව.

* ආපසු අය නොකරන පරිදි මූල්‍යාධාර ලබා දීමේ පදනම මත ජීවනෝපාය සංවර්ධනය සඳහා රජයේ ආධාර ලබා දීම මුදල් කොමිෂන් සභාවේ අදාළ නිර්දේශය මගින් දක්වා ඇති පුද්ගලයන්/කාණ්ඩයන් සඳහා පමණක් ක්‍රියාත්මක කිරීමත්, ලාභදායී ආර්ථික කටයුතු ආරම්භ කිරීම පිණිස ලබා දෙන රජයේ මූල්‍ය දායකත්වය පොලී රහිත/ සහනශීලී ණය ක්‍රමයන් යටතේ ප්‍රතිලාභීන් වෙත ලබාදීමත් යෝග්‍ය බව හා ඒ පිළිබඳ අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමු කිරීම යෝග්‍ය බව.

* විමධ්‍යගත විෂයයන්ට අදාල වන ව්‍යාපෘති සම්බන්ධයෙන් වන යෝජනා සංවර්ධන පාර්ශ්වකාර ආයතන සමග සාකච්ඡා කිරීමේදී; (i) පළාත් සභාවල පූර්ණ සහභාගිත්වය ලබා ගැනීම හා සංකූලතා අවම වන මූල්‍ය ප්‍රවාහ ක්‍රමවේදයක් යොදා ගැනීම, (ii) දේශීය අරමුදල් යොදා ගනිමින් අඩු පිරිවැයක් යටතේ ඉදි කළ හැකි කුඩා පරිමාණයේ ව්‍යාපෘති/ක්‍රියාකාරකම් විදේශාධාර ව්‍යාපෘතිවලට ඇතුළත් නොකිරීම, (iii) හැකිතාක් දුරට සැලසුම්ගත ක්‍රියාකාරකම් වෙනුවෙන් විදේශාධාර හිලව් කිරීමේ ක්‍රමවේදය (Budget Support mode) ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම, (iv) පළාත් සංරචකයට අදාළ ඉදිකිරීම් හා මිළදී ගැනීම් සඳහා (අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ කරගෙන යාමට) පළාත් සභාවන් හට ඉඩ දීම යන කරුණු කෙරෙහි නිසි අවධානය යොමු කරන ලෙස විදේශ සම්පත් දෙපාර්තමේන්තුවටත්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවටත් උපදෙස් ලබා දීම සුදුසු බව.

* සිසුන් 50ට අඩු කුඩා පාසල් ඒ ආසන්නයේ පිහිටි වෙනත් පාසල්වලට ඒකාබද්ධ කිරීම කොළඹ දිස්ත්‍රික්කයේ පහසුවෙන් සිදු කළ හැකි බැවින් එය නියමු ව්‍යාපෘතියක් ලෙස කොළඹ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත්, අවශ්‍ය යැයි හැඟෙන ළමුන් සඳහා ප්‍රවාහන දීමනාවක් ලබා දීම තුළින් එම ක්‍රියාවලිය දිරිමත් කළ හැකි බවටත් වන මුදල් කොමිෂන් සභාවේ යෝජනාව සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමියගේ හා ගරු අධ්‍යාපන අමාත්‍යතුමියගේ අවධානය යොමු කිරීම සුදුසු බව.

* පළාත් සභාව යටතේ ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි මහජනතාව විමසිලිමත්ව සිටීමට පහසුකම් සැලසීම සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභා සඳහා හඳුන්වාදෙනු ලැබූ වැඩපිළිවෙළ තුළින් ව්‍යාපෘති පසුවිපරම් කිරීම වඩාත් සාර්ථක වනු ඇති බව පෙනෙන බැවින්, එම යෝජනාව රේඛීය අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් ද අදාළ කර ගැනීම සුදුසු බව.

* ආයතනගත ළමුන් රැකබලා ගැනීමේදී එම ක්ෂේත්‍රයේ මානව සම්පත් සම්බන්ධයෙන් උග්‍ර ගැටළුවක් ඇති බවට මුදල් කොමිෂන් සභාවේ නිර්දේශවල සඳහන් පරිදි පරිවාස දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය සේවක සංඛ්‍යාව ලබා දීමට විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු බව හා දැනට කරගෙන යනු ලබන කාර්ය මණ්ඩල සමාලෝචනය අවසන් වන තෙක් නොසිට පළාත් පරිවාස දෙපාර්තමේන්තු සඳහා අවශ්‍ය තනතුරු ඇති කිරීමටත් පුරප්පාඩු වී ඇති තනතුරු පිරවීමටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කටයුතු කළ යුතුව ඇති බව.

මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවලට අදාළව, අංක CP/25/2195/801/027 හා 2025.11.24 දිනැතිව ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණ පහත පරිදි වේ.

(i) මුදල් කොමිෂන් සභාව විසින් යෝජනා කර ඇති පරිදි, 2026 වර්ෂය තුළ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති කල්වේලා ඇතිව සැලසුම් කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරුන්ට සහ අමාත්‍යාංශ යටතේ ඇති ආයතන ප්‍රධානීන්ට උපදෙස් ලබා දෙන මෙන් අමාත්‍ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ගෙන් ඉල්ලා සිටීම.

(ii) ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා රජයේ ආධාර ලබා දීම සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව විසින් යෝජනා කර ඇති පරිදි සැලසුම් කිරීම සඳහා අදාළ රාජ්‍ය ආයතන මෙහෙයවීමට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට උපදෙස් දීම.

(iii) විමධ්‍යගත විෂයයන්ට අදාළව විදේශාධාර ව්‍යාපෘති සැලසුම් කිරීමේදී මුදල් කොමිෂන් සභාව විසින් යෝජනා කර ඇති පරිදි ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කළ යුතු බවට උපදෙස් දීම.

(iv) සිය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති පසුවිපරම් කිරීමේදී මුදල් කොමිෂන් සභාව විසින් යෝජනා කර ඇති පරිදි මහජන සහභාගීත්වය ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට නියම කිරීම.

(v) මුදල් කොමිෂන් සභාව විසින් යෝජනා කර ඇති පරිදි ග්‍රාමීය ප්‍රදේශවල සහ වතු වැවිලි ප්‍රදේශවල පාසල් ප්‍රතිසංවිධානය නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට නියම කිරීම.

(vi) මුදල් කොමිෂන් සභාව විසින් යෝජනා කර ඇති පරිදි, පරිවාසගත දරුවන් රැකබලා ගැනීමේ කාර්ය මණ්ඩල අවශ්‍යතාවය සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට නියම කිරීම.

2.3 අභියෝග සහ අනාගත දැක්ම

ශ්‍රී ලංකාව මෑත කාලීනව මුහුණ දුන් කොවිඩ් -19 ගෝලීය වසංගත තත්ත්වය සහ ආර්ථික අර්බුදයෙන් පසුව, 2025 වර්ෂය අවසාන භාගයේදී අත්විඳීමට සිදු වූ 'දිට්වා' ('Ditwah') සුළි කුණාටුවෙන් ඇති වූ අධික ගංවතුර හා නාය යාමේ තත්ත්වයන් හේතුවෙන් නැවතත් දැඩි සමාජ ආර්ථික ගැටළු සමූහයකට බඳුන් වී ඇත. විශේෂයෙන්ම, පසුගිය වසරේ ඇති වූ එම ස්වභාවික ආපදා තත්ත්වය හේතුවෙන් මධ්‍යම පළාත, උතුරු මැද පළාත, ඌව පළාත ආදී පළාත් කිහිපයක ජන ජීවිතය සහ යටිතල පහසුකම් රැසක් දැඩි ලෙස හානියට පත්වී ඇති අතර, අනෙකුත් පළාත් ද සැලකිය යුතු ලෙස ආපදාවට ලක්ව ඇත.

මෙහිදී, පළාත් සභා සඳහා විමධ්‍යගත කර ඇති විෂයයන්ට අදාළව සමාජ ආර්ථික ගැටළු විශාල ප්‍රමාණයක් සඳහා විසඳුම් සෙවීමට පළාත් සභා යාන්ත්‍රණයට සිදුව ඇති බැවින්, ආපදාවෙන් හානියට පත් වූ රට නැවත නගා සිටුවීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික මට්ටමේ වැඩපිළිවෙල සමග පළාත් සභා ද ඒකාබද්ධ කරමින් අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීමට මුදල් කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ලබයි.

තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීමේ අපේක්ෂාවෙන් මුදල් කොමිෂන් සභාව විසින් ආණ්ඩුවේ වාර්ෂික අයවැයෙන් වෙන් කරනු ලබන අරමුදල් විද්‍යානුකූල පදනමක් මත පළාත් අතර බෙදා දීමට කටයුතු කලද, වාර්ෂික අයවැයෙන් ඉතා විශාල අරමුදල් ප්‍රමාණයක් වෙන් වන රේඛීය අමාත්‍යාංශ විසින් අදාල අරමුදල් ආයෝජනය කිරීමේදී විද්‍යානුකූල පදනමක් යොදා නොගැනීම මත රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීම අභියෝගයක්ව පවතී.

තවද, මුදල් කොමිෂන් සභාවේ මැදිහත්වීම මත සියළුම පළාත් සභා විසින් පොදු ආකෘතියකට අනුව වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කරනු ලබන නමුත්, රේඛීය අමාත්‍යාංශවල එබඳු සැලසුම්කරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවේ. පළාත් සහ ජාතික මට්ටමේ ඒකාබද්ධ සංවර්ධන සැලසුම් යාන්ත්‍රණයක් නොතිබීම හේතුවෙන් ක්ෂේත්‍රයේදී සිදු කරන සමාන ක්‍රියාකාරකම් ද්විකරණය වීම සහ අතිච්ඡේදනය වීම මත පවත්නා සීමිත සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට නොහැකි වීම සහ සම්පත් අපතේ යාම සිදු වේ.

පළාත් සභා වෙත පැවරී ඇති විමධ්‍යගත විෂයයන්ට අදාළ ක්‍රියාකාරකම් ඇතුළත් වන විදේශාධාර ව්‍යාපෘති සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී බොහෝ විට අදාළ පළාත් සභා යාන්ත්‍රණය යොදා ගැනීමෙන් තොරව රේඛීය අමාත්‍යාංශ විසින් ව්‍යාපෘති කාර්යාල යොදා ගනිමින් එම කටයුතු මෙහෙය වීම තුළ විශාල සම්පත් නාස්තියක් සිදු වන අතර, මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ අනුව තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා පාදක වන අයුරින් එම අරමුදල් ආයෝජනය වීම සිදු නොවේ.

කෙසේ වෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මුදල් කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යභාරය ඉටු කිරීම මගින් රටෙහි සංවර්ධන අභිමතාර්ථ ළඟා කර ගැනීම සඳහා දක්වනු ලබන දායකත්වය හා මැදිහත්වීම ඊට අදාල සංදර්භයන් තුළ අඛණ්ඩව ක්‍රියාවට නැංවීමට මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරියේදීත් කටයුතු කරනු ඇත.

පරිච්ඡේදය - 03: 2025 දෙසැම්බර් 31 අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	තතය 2025 රු.	2024 රු.	
	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		119,608,000	101,034,000	ඒසීඒ-3
-	තැන්පතු		187,643	142,220	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		3,211,051	3,998,693	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**123,006,694**	**105,174,913**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**123,006,694**	**105,174,913**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		**30,329**	**892,132**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**122,976,365**	**104,282,781**	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
77,350,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	75,851,291	61,617,586	ඒසීඒ-2(ii)
54,025,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	45,322,924	40,101,413	ඒසීඒ-2(ii)
825,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	544,799	613,158	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	ඒසීඒ-2(ii)
132,200,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**121,719,014**	**102,332,157**	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	ඒසීඒ-2(ii)
400,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	397,319	1,666,431	ඒසීඒ-2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසීඒ-2(ii)
400,000	හැකියා වර්ධනය	14	255,602	297,505	ඒසීඒ-2(ii)
-	වෙනත් මූලධන වියදම්	15	-	-	ඒසීඒ-2(ii)
800,000	**මුළු මූලධන වියදම් (උ)**		**652,921**	**1,963,936**	
	තැන්පතු ගෙවීම්		109,425	142,220	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		4,613,458	2,906,189	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**4,722,883**	**3,048,409**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**127,094,818**	**107,344,502**	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**(4,118,452)**	**(3,061,721)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(4,118,452)	(3,061,721)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	සත්‍ය 2025 රු.	2024 රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	807,456,423	807,288,825
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	9,603,550	8,201,144
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**817,059,973**	**815,489,969**
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		9,525,332	8,201,144
දේපළ පිරියත හා උපකරණ සංචිතය		807,456,423	807,288,825
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**	-	-
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	78,218	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**817,059,973**	**815,489,969**

පිටු අංක 7 සිට 24 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 25 සිට 52 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ** අංක **02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	දිනය : 2026/02/16
දිනය : 16/02/2026	දිනය :	

ඒ.ටී.එම්.යූ.ඩී.බී. තෙන්නකෝන්
ලේකම්
මුදල් කොමිෂන් සභාව
අංක 03, සරණ මාවත
රාජගිරිය.

ප්‍රධාන ගණකාධිකාරී
මුදල් කොමිෂන් සභාව
අංක 03, සරණ මාවත, රාජගිරිය

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-8

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය 2025 රු.	සංශෝධිත 2024 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	3,933,413	3,139,735
අග්‍රිම ලැබීම්	119,608,000	101,034,000
අත්තිකාරම් අයකර ගැනීම්	3,530,165	3,826,779
තැන්පතු ලැබීම්	187,643	142,220
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**127,259,221**	**108,142,734**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	121,011,614	101,537,599
සහනාධාර සහ මාරුකිරීම්	544,799	613,158
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම , මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	255,602	297,505
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	296,675	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	30,329	892,132
අත්තිකාරම් ගෙවීම්	4,613,458	2,993,689
තැන්පතු ගෙවීම්	109,425	142,220
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**126,861,902**	**106,476,303**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**397,319**	**1,666,431**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	397,319	1,666,431
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**397,319**	**1,666,431**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(397,319)**	**(1,666,431)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

වාර්තාකිරීමේ පදනම

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

8) 2024 වර්ෂයේ සංසන්ධනාත්මක තොරතුරු

2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල හඳුනා ගන්නා ලද දෝෂයන් නිවැරදිකොට, 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වල සංසන්ධනාත්මක තොරතුරු ඉදිරිපත්කොට ඇත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කළ ආදායම	
		මූලික	අවසාන	මුදල (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.02.99	පොලී - වෙනත්	330,000.00	330,000.00	377,691.91	114%
2003.99.00	විකුණුම් ආදායම් හා ගාස්තු - වෙනත්	30,000.00	30,000.00	45,927.21	153%
2004.01.00	වැන්දඹු හා අනත්දරු අරමුදල	-	-	3,480,313.77	-
2006.02.02	මූල්‍ය නොවන වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම් - වෙනත්	12,000.00	12,000.00	29,480.00	245%

3.6 ප්‍රතිපාදන භාවිතා කිරීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කිරීම (රු.)		සත්‍ය වියදම (රු.)	අවසාන ප්‍රතිපාදනයෙන් % ක් ලෙස ප්‍රතිපාදන භාවිතය
	මූලික	අවසාන		
පුනරාවර්තන	132,200,000	132,200,000	121,719,014	92%
ප්‍රාග්ධන	800,000	800,000	652,921	82%

3.7 මු.රෙ.208 ප්‍රකාරව මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස පළාත් සභාවට, වියදම් සඳහා ප්‍රතිපාදන ප්‍රදානය කිරීම.

අනුක්‍රමික අංකය	ප්‍රතිපාදන ලැබී ඇත්තේ කුමන අමාත්‍යාංශයෙන්/ දෙපාර්තමේන්තුවෙන්ද?	වෙන්කිරීමේ අරමුණ	වෙන් කිරීම		සත්‍ය වියදම (රු.)	අවසාන ප්‍රතිපාදනයෙන් % ක් ලෙස ප්‍රතිපාදන භාවිතය
			මූලික	අවසාන		
01	මැතිවරණ කොමිෂන් සභාව	ජන්ද කාර්යය මණ්ඩලයට ගෙවීම් සඳහා	296,675	296,675	296,675	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	**2025/12/31** දිනට සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය (රු.)	**2025/12/31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාවට අනුව ශේෂය (රු.)	තවමත් ගණන් ගත යුතුව ඇති	ප්‍රගතිය වාර්තා කිරීම % ලෙස
9151	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	449,009,540.32	449,009,540.32	-	100%
9152	යන්ත්‍රෝපකරණ සහ උපකරණ	100,446,882.85	100,446,882.85	-	100%
9153	ඉඩම්	258,000,000.00	258,000,000.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9160	වැඩ කෙරෙමින් පැවතීම	-	-	-	-
9180	කල්බදු වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	PIC/C/FC/2/25/18	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2026 මැයි 26 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

මුදල් කොමිෂන් සභාව

ශීර්ෂය 011 - මුදල් කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 011 - මුදල් කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මුදල් කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව මුදල් කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මුදල් කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මුදල් කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

රජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව 2025 වර්ෂයේදී වියදම් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය වූ අතර විස්තර පහත පරිදි වේ.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 09ක් හා එක් මූලධන වැය විෂයයකට අදාලව වෙන්වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.4,913,419ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණු අතර එය සියයට 30 සිට සියයට 72 දක්වා වූ පරාසයක් ගෙන තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 04ක් සඳහා මුලික ඇස්තමේන්තුව මඟින් අධි ප්‍රතිපාදන සලසාගෙන තිබීම හේතුවෙන් මු.රෙ. 66 යටතේ එකතුව රු.2,600,000ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් සඳහා මාරු කර තිබූ අතර එම මාරු කිරීම් අගය මුල් ඇස්තමේන්තුවෙන් සියයට 20 සිට සියයට 83 දක්වා පරාසයක පැවතුණ

(ඈ) ඌන ප්‍රතිපාදන පැවති පුනරාවර්තන වැය විෂයයන් 03ක් සඳහා රු.3,600,000 ක් මු.රෙ. 66 මඟින් අතිරේක ප්‍රතිපාදන සලසාගෙන තිබූ අතර එය මුල් ඇස්තමේන්තුවෙන් සියයට 42 සිට සියයට 88 දක්වා පරාසයක පැවතුණි.

3.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම

සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මඟින් ලැබීම්වල අවම සීමාව ලෙස නියම කර තිබූ රු.3,200,000 ලගා කර ගැනීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණු අතර ළඟා කරගෙන තිබූ ලැබීම් ප්‍රමාණය රු.2,895,736ක් පමණක් විය.
කොමිෂන් සභාව විසින් අවම ලැබීම් සීමාව සංශෝධනය කර ගැනීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර තිබුණද, ඒ සඳහා අදාල අනුමැතිය ලැබී නොතිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.1.2 කාර්යභාරය ඉටු කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන අනුව මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යය වනුයේ රටතුල තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීම පිණිස පළාත් අවශ්‍යතා සඳහා ජාතික අයවැයෙන් ප්‍රමාණවත් අරමුදල් වෙන් කර ගැනීම හා එම අරමුදල් පළාත් නවය අතරබෙදා දීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති පිළිබඳ නිර්දේශ රජය වෙත හා ජනාධිපති වෙත ඉදිරිපත් කිරීම වන අතර මෙම ක්‍රියාවලි සඳහා සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් ඉටුකල කාර්යයන් පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

(අ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පළාත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ මත අයවැය මඟින් 2022, 2023, 2024 හා 2025 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 10,111 ක්, රු. මිලියන 16,900 ක්, රු. මිලියන 25,000 ක් සහ රු. මිලියන 64,000 ක් අයවැය මඟින් වෙන්කර දී තිබුණද ඊට අදාලව අක්මුදල් නිදහස් කිරීම් පිළිවෙලින් රු.මිලියන 5,055ක්, රු.මිලියන 8,600 ක්, රු.මිලියන 17,889 ක් සහ රු. මිලියන 51,426 ක් හෙවත් අයවැය ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 50 ක්, සියයට 51 ක්, සියයට 72 ක් සහ සියයට 80 ක් පමණක් විය.
මේ අනුව පළාත් සංවර්ධන වැඩසටහන් සඳහා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ මත අයවැය ප්‍රතිපාදන ලබාදුන්නද ප්‍රමාණවත් පරිදි භාණ්ඩාගාරය විසින් අක්මුදල් නිදහස් නොකිරීම නිසා සැලසුම්කල පරිදි පළාත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට

නොහැකි වන අතර ප්‍රාදේශීය තුලිත සංවර්ධනය ඇති කිරීමේ අරමුණද ඉටුනොවන බව නිරීක්ෂණය කෙරේ.

(ආ) පළාත් සංවර්ධන වැඩසටහන් සඳහා පළාත් වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන හා නිදහස් කරන ලද අක්මුදල් ප්‍රමාණය පිළිබඳ සමාලෝචිත වර්ෂයට අදාල ජනාධිපති නිර්දේශ වාර්තාවේ දක්වා තිබුණද, සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිමේ මූල්‍ය කාර්යසාධනය පරික්ෂා කිරීමට හැකිවන ලෙස එක් එක් පළාත සඳහා මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය මත ප්‍රතිපාදන වෙන් කරන ලද සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වැයකරන ලද මුදල් ප්‍රමාණය පිලිබදව දත්ත නොමැති වීම හේතුවෙන් පළාත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ මූල්‍ය ප්‍රගතිය පිළිබඳ පරික්ෂා කිරීමට නොහැකි වනවා මෙන්ම සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් නිදහස් කරන ලද අක්මුදලින් ඉතිරි වූ මුදල් ප්‍රමාණයක් ඇත්නම් එය කොපමණද හා ඒ සඳහා පළාත් විසින් ගත් ක්‍රියාමාර්ග මොනවද යන්න පිලිබඳ තහවුරු කරගත නොහැකි විය.

(ඇ) අරමුදල් භාවිතයේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සැකසීමට අදාලව, පළාත් සභා වෙත මාර්ගෝපදේශ නිකුත් කර, ඒ අනුව පළාත් විසින් සකස් කරන ලද සංවර්ධන සැලසුම් සමාලෝචනයට ලක්කර මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා දේ. ඒ අනුව එක් එක් පළාත් සඳහා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ මත මධ්‍යම රජය විසින් ලබාදෙන අරමුදල් ක්ෂේත්‍ර 23ක් ආවරණය කරමින් පළාත් විසින් සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කරණ නමුත් මෙම ප්‍රතිපාදන උපයෝජනය කරමින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් පිළිබඳ ගැඹුරු භෞතික අධීක්ෂණය හා පසු විපරම් සිදු කොට සැලසුම්වල සඳහන් අපේක්ෂිත නිමැවුම් හා ප්‍රතිඵල අත්කරගෙන තිබේද යන්න පිළිබඳ සොයාබලා වාර්තා කිරිම සඳහා වගකීම පැවරුණු ස්වාධින ආයතනයකින් හෝ පාර්ශ්වයකින් සිදු නොවන අතර ඒ පිළිබඳව දැක්විය යුතු නිර්දේශ සමාලෝචිත වර්ෂයට අදාලව ගරු ජනාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබූ නිර්දේශ පිළිබඳ වාර්තාවේ සඳහන් කර නොතිබුණි.

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ජ) (6) අනුව්‍යවස්ථාව පරිදි කොමිෂන් සභාව විසින් ස්වකීය කාර්ය පටිපාටිය තීරණය කර එම කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය බලතල පැවරීම පාර්ලිමේන්තුව විසින් නීති මගින් කොමිෂන් සභාව වෙත පැවරීමක් සිදු කරන බව දක්වා තිබුණද, 2025 දෙසැම්බර් 31 දින තෙක් අනුව්‍යවස්ථාව පරිදි මුදල් කොමිෂන් සභාවේ කාර්යයන් පිළිබඳ කාර්ය පටිපාටියක් සකස්කර එය ක්‍රියාත්මක කිරීමේ බලය පාර්ලිමේන්තුව වෙතින් ලබාගෙන නොතිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) 2024 භාණ්ඩ වැඩ සහ උපදේශන නොවන සේවා පිලිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 04 වැනි පරිච්ඡේදයේ දක්වා ඇති ඇමුණුම්හි සඳහන් ආකෘතීන්ට අනුව සකස් කල යුතු සමාලෝචිත වර්ෂයේ පූර්ව සූදානම් සැලැස්ම (PP) සහ ප්‍රසම්පාදන කාල සටහන (PTS) විගණනය වෙත ඉදිරිපත්කර නොවුණි.

(ආ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය සඳහා හඳුන්වා දී ඇති විද්‍යුත් ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතිය (Electronic Procurement Management System - ePMS) තුලට සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලසුම් ඇතුලත්කර පද්ධතිය යාවත්කාලින කිරීම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් අදාල මූලික පුහුණුවීම් හා දැනුවත්කිරීමේ වැඩසටහන් කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත ලබා දී තිබුණද, 2025 දෙසැම්බර් 31 දින දක්වා අදාල සියළුම ප්‍රසම්පාදන සැලසුම් අධීක්ෂණ පද්ධතියට ඇතුලත්කර එම කාර්යය සම්පූර්ණ වශයෙන් ඉටු කර නොතිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

2025 දෙසැම්බර් 31 දිනට තොග පොත සහ CIGAS පරිගණක පද්ධතියෙහි ස්ථාවර වත්කම් යටතේ වන BOS Report එකිනෙක හා සැසඳීමේදී වත්කම් අයිතම 45 කට අදාලව වත්කම් 518 ක වෙනසක් නිරීක්ෂණය විය.

4.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) පරිගණක යන්ත්‍ර සහ අනෙකුත් උපකරණ 04 ක් සඳහා නඩත්තු සේවා කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ එළඹි සේවා ගිවිසුමක් ප්‍රකාරව එක් එක් යන්ත්‍රය සඳහා වසරකට වැළැක්වීමේ සේවා (Preventive Services) වාර 02 ක් සිදු කරන බව දක්වා තිබුණද, යන්ත්‍ර 81 කට අදාලව පළමු සේවා වාරයේදී යන්ත්‍ර 31 ක් හා දෙවන සේවා වාරයේදී යන්ත්‍ර 27 ක් සඳහා පමණක් සේවා කිරීම සිදුකර තිබුණු අතර CCTV සහ Network Switches සඳහා ගිවිසුම් ප්‍රකාරව වාර්ෂික සේවා සිදු කර තිබූ බව ලේඛන පරික්ෂාවේදී තහවුරු නොවීය.

(ආ) ෆැක්ස් යන්ත්‍ර 03, සේවා කිරීම සඳහා ගිවිසුම්ගතව තිබුණද, 2025 දෙසැම්බර් 31 දිනට CIGAS Bos Report අනුව කොමිෂන් සභාව යටතේ ගිණුම්ගතවී තිබුනේ ෆැක්ස් යන්ත්‍ර 02 ක් පමණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 මානව සම්පත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුව කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා පැවැත්වීමට අපේක්ෂිතව තිබූ පුහුණු ක්ෂේත්‍ර වන ප්‍රසම්පාදනය, පර්යේෂණ යෝජනා, සන්නිවේදන කුසලතා, අන්තර් පුද්ගල සම්බන්ධතා, කාර්මික කුසලතා, ලේඛන හැකියාව, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, පරිගණක දත්ත විශ්ලේෂණය, තාක්ෂණික ඇඟයීම් පිළිබඳ පුහුණුව සහ සංඛ්‍යාත්මක කුසලතා පිලිබඳ පුහුණු වැඩසටහන් පවත්වා නොතිබුණි.

5.2 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය

2025 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 85 ක් වුවද, තත්‍ය සේවක සංඛ්‍යාව 72 ක් වුයෙන් නිලධාරීන් 13 ක පුරප්පාඩු පැවතුණි. එයින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 05 ක් වූ අතර එය අනුමත සංඛ්‍යාවෙන් සියයට 31 ක් විය.

තත්‍ය සේවක සංඛ්‍යාව තුල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 අනුව දේශීය/විදේශීය නිවාඩු ලබාගෙන ඇති නිලධාරීන් සංඛ්‍යාව 10 ක් විය. මෙසේ පුරප්පාඩු පැවතීම කොමිෂන් සභාවේ කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

කේ.කේ.එස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය - 04: කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	90%- 100%	**75%-89%**	**50%- 74%**
පළාත් ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා - 2026 තක්සේරු කිරීමේ මාර්ගෝපදේශ නිකුත් කිරීම	√		
පළාත් පුනරාවර්තන වියදම් අවශ්‍යතා - 2026 තක්සේරු කිරීමේ මාර්ගෝපදේශ නිකුත් කිරීම	√		
2026 වසර සඳහා පළාත් ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා තක්සේරු කිරීම.	√		
2026 වසර සඳහා පළාත් පුනරාවර්තන වියදම් අවශ්‍යතා තක්සේරු කිරීම.	√		
2026 වසර සඳහා නිර්දේශය ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීම.	√		
2026 වර්ෂයේ පළාත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම.	√		
2026 වසර සඳහා පළාත් නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම	√		
පළාත් සංවර්ධන සැලසුම් - 2025 සහ 2026 සමාලෝචනය කිරීම සහ එකඟතාව ලබා දීම.	√		
කාර්යාලයේ මූල්‍ය සහ පරිපාලන කටයුතු කළමනාකරණය කිරීම.	√		
මුදල් කොමිෂන් සභාවේ 2024 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.	√		

පරිච්ඡේදය - 05: තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගත් අදාළ තිරසර සංවර්ධන ඉලක්ක

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ඉලක්ක ළඟා කර ගැනීම පිළිබඳ දර්ශක	මේ දක්වා ලබා ඇති ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
ඉලක්කය 1: සෑම තැනකම සෑම ආකාරයකින්ම දුප්පත්කම අවසන් කිරීම	1.4 විශේෂයෙන්ම දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියලුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපළ උරුමයන්, ස්වාභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශවීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම. 1.a විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල පවත්නා සියලුම ආකාරයේ දරිද්‍රතාවන් තුරන් කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් සහ විශ්වාසය තැබිය හැකි ක්‍රමවේද සම්පාදනය කිරීම සඳහා වැඩිදියුණු කරන ලද සංවර්ධන සහයෝගිතාව ඇතුළු විවිධ වූ මූලාශ්‍රයන් මගින් සම්පත් ලබා දීම කැපීපෙනෙන ආකාරයෙන් වර්ධනය කිරීම. 1.b දරිද්‍රතාව තුරන් කිරීමේ ක්‍රියාවලීන් සඳහා ආයෝජනය කිරීම වේගවත් කිරීමට, දරිද්‍රතාවෙන් පෙළෙන අය සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ජාතික, කලාපීය සහ අන්තර්ජාතික මට්ටමේ ප්‍රතිපත්ති රාමු නිර්මාණය කිරීම.	• මුදල් කොමිෂන් සභා නිර්දේශය • පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ • වාර්ෂික පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම • පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම • නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ • පාසල් පෝෂණ ආහාර වැඩසටහන සඳහා මාර්ගෝපදේශ			√ √ √ √ √ √

ඉලක්කය 8: තිරසාර ආර්ථික වර්ධනය සියලු දෙනාටම පූර්ණ හා ඵලදායී රැකියාවක් සහ යහපත් රැකියාවක් සමග ප්‍රවර්ධනය කිරීම	8.3 ඵලදායී ක්‍රියාකාරකම් වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලීභාවයට සහාය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තීන් ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර, කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරිගැන්වීම.	• මුදල් කොමිෂන් සභා නිර්දේශය • පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ • නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ • පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම			√ √ √ √
ඉලක්කය 10: රටවල් තුළ සහ රටවල් අතර අසමානතාවය අඩු කිරීම	10.3 ප්‍රතිලාභ බෙදීයාමේදී සමාන අවස්ථාවන් පැවතීම තහවුරු කිරීම, පවත්නා අසමානතාවන් අවම කිරීම සහ වෙනස්කොට සැලකීමට තුඩුදෙන්නා වූ නීති, ප්‍රතිපත්ති සහ භාවිතාවන් ඉවත් කිරීම සහ මේ සම්බන්ධයෙන් සුදුසු නීති ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ගැනීම.	• මුදල් කොමිෂන් සභා නිර්දේශය • පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ • වාර්ෂික පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම • පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම			√ √ √ √

5.2 තිරසර සංවර්ධන ඉලක්කවල ජයග්‍රහණ සහ අභියෝග

තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් ඍජුවම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නොකරන නමුත් සිය ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටු කිරීමේදී මුදල් කොමිෂන් සභාව විසින් ඒ සඳහා පුළුල් පරාසයක විෂයන් ඔස්සේ සැලකිය යුතු දායකත්වය ලබා දේ. එනම්, පළාත්වල අවශ්‍යතා තක්සේරු කිරීම සිදු කර පළාත් සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කර දීම සඳහා රජය වෙත නිර්දේශ ලබා දීම හා ඒ අනුව, වාර්ෂික අයවැයෙන් රජය විසින් වෙන් කරනු ලබන අරමුදල් ප්‍රාදේශීය තුලිත

සංවර්ධනයක් අත් කර ගැනීමේ අරමුණින් පළාත් අතර බෙදා වෙන් කිරීම සහ වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා පළාත් සභාවලට මාර්ගෝපදේශ නිකුත් කිරීමේදී පළාත් සභාවල සංවර්ධන ක්‍රියාකාරකම් ඔස්සේ තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

සමාජ, ආර්ථික සහ පාරිසරික අංශවල පුළුල් පරාසයක් තුළ පැතිර පවතින තිරසර සංවර්ධන ඉලක්ක බොහොමයක් පළාත් සභා වෙත පැවරී ඇති විෂයන්ට අදාළ වන අතර, පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා මෙන්ම නඩත්තු ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශයන්හි තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සම්බන්ධයෙන් පළාත් සභාවල අවධානය යොමු කරවනු ලබයි.

ඒ අනුව, පළාත් සභා විසින් පහත සඳහන් අංශ ඔස්සේ වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කරනු ලබන අතර, එම සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීමේදී ද තිරසර සංවර්ධන ඉලක්ක ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම පිළිබඳවද අවධානයට ලක් කරමින් අදාළ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභා වෙත මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා දේ.

* අධ්‍යාපන
* සෞඛ්‍ය
* දේශීය වෛද්‍ය
* ක්‍රීඩා
* පරිවාස හා ළමාරක්ෂණ
* සමාජ සේවා
* සංස්කෘතික හා ආගමික කටයුතු
* සමූපකාර සංවර්ධනය
* පූර්ව ළමාවිය සංවර්ධනය
* පළාත් මාර්ග
* වතු යටිතල පහසුකම්
* ප්‍රවාහන
* නිවාස
* ග්‍රාම සංවර්ධනය
* පළාත් පාලනය
  - පළාත් පාලන මාර්ග
  - ප්‍රජා ජල සැපයුම
  - කසළ කළමනාකරණය
  - වෙනත් සේවා
* ඉඩම් සංවර්ධනය
* වාරිමාර්ග
* කෘෂිකර්මය
* පශු සම්පත්
* මිරිදිය ධීවර
* කුඩා කර්මාන්ත
* සංචාරක කටයුතු
* ග්‍රාමීය විදුලිය

(පළාත් සභා ලැයිතුවේ අංක 34 අයිතමයෙහි විෂය සීමාව තුළ)

කෙසේ වුවද, මුදල් කොමිෂන් සභාව විසින් රජයේ වාර්ෂික අයවැයෙන් පළාත් සභා සඳහා වෙන් කිරීමට නිර්දේශ කරනු ලබන අරමුදල් ප්‍රමාණයට සාපේක්ෂව, පවත්නා සීමිත සම්පත් හේතුවෙන් රජය විසින් පළාත් සභා සඳහා වාර්ෂිකව වෙන් කෙරෙනුයේ අඩු අරමුදල් ප්‍රමාණයක් බැවින්, ඉහත කී අරමුණු සාක්ෂාත් කර ගැනීම අභියෝගයක් වේ. 2025 වර්ෂයේ සිට පෙර වර්ෂවලදීට වඩා සැලකිය යුතු ප්‍රතිපාදන ප්‍රමාණයක් පළාත් සභා වෙත වාර්ෂික අයවැයෙන් වෙන් කර තිබීම එම තත්ත්වය යම් පමණකට සමනය වීමට හේතු වී ඇතත්, පළාත් සභා විෂයයන් ආවරණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික කාර්ය මණ්ඩලය හා යන්ත්‍රෝපකරණවල හිඟතාවය, ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැති වීම, සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරුවන් ප්‍රාදේශීයව සොයා ගැනීමට අපහසු වීම මෙන්ම අමුද්‍රව්‍ය හිඟතාවය වැනි දුෂ්කරතා හේතුවෙන් සංවර්ධන ක්‍රියාකාරකම් ඉටු කිරීමේදී පළාත් සභාවල ධාරිතාවය ඇතැම් අවස්ථාවලදී ගැටළු සහගත වී ඇත.

පරිච්ඡේදය - 06: මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව (31.12.2025)	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	16	11	05
තෘතීයික	05	03	02
ද්විතියික	47	37	10
ප්‍රාථමික	17	11	06
එකතුව	**85**	**62**	**23**

6.2 මානව සම්පත් හිඟය හෝ අතිරික්තය ආයතනයේ ක්‍රියාකාරිත්වයට බලපා ඇති ආකාරය

මුදල් කොමිෂන් සභාවේ දැනට සිටින කාර්ය මණ්ඩලයට එහි ක්‍රියාකාරී සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් ඉටු කිරීමට අමතර පැය ගණනක් වැඩ කිරීමට සිදු වේ. කෙසේ වෙතත්, සිටින කාර්ය මණ්ඩලය සඳහා තිබෙන ඉහළ වැඩ ප්‍රමාණය, නිමැවුමේ ගුණාත්මක භාවයට බලපෑ හැකිය. ඒ අතරම, මානව සම්පතෙහි ධාරිතාව සීමිත බැවින් ක්‍රියාකාරී සැලැස්මේ කාලසීමාවන් සපුරාලීම ඇතැම් විට අභියෝගයකි.

6.3 මානව සම්පත් සංවර්ධනය (දේශීය හා විදේශීය පුහුණු)

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම
				දේශීය (රු.)	විදේශීය (රු.)		
1	Diploma in Office Management	1	2024/2025	110,000.00		දේශීය	ආයතතනික වැඩ ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම
2	Diploma in Profesional English	1	2024/2025	46,000.00		දේශීය	රාජකාරී කටයුතු කිරීම සඳහා ඉංග්‍රීසි දැනුම
3	රාජ්‍ය නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය කිරීම -: සම්පත් දායකත්වය - පී.සුසන්ත ජයතිලක මයා (සාමාන්‍යාධිකාරී - ශ්‍රී ලංකා මිනරල්ඩ් සැන්ඩ්)	60	2025/03/04	5,600.00		දේශීය	රාජ්‍ය නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය සහ දැනුම
4	කාර්යාල කළමනාකරණය -: සම්පත් දායකත්වය - වයි.කේ.එස්.එස්.බී. යටිවැල්ල මයා (අධිකරණ අමාත්‍යංශයේ පරිපාලන නිලධාරී)	60	2025/08/27	5,600.00		දේශීය	ආයතනික කළමනාකරණය, ආයතනික වැඩ ක්‍රියා පටිපාටි ආයතන සංග්‍රහය පිළිබඳ දැනුම
5	ගිනි නිවීමේ ආරක්ෂණ පද්ධතිය පිළිබඳ දේශනය හා ප්‍රායෝගික පුහුණුව	60	2025/08/29 2025/09/15	-		දේශීය	ගිනි ගැනීම් අවස්ථාවකදී මුහුණ දිය යුතු ආකාරය පිළිබඳ ප්‍රායෝගික අවබෝධය
6	Google app and AI tools training	1	2025/09/13	6,000.00		දේශීය	Google app and AI tools භාවිතය පිළිබඳ දැනුම
7	Income tax training	2	2025/09/19	16,000.00		දේශීය	ආදායම් බදු සැකසීම පිළිබඳ දැනුම

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම
				දේශීය (රු.)	විදේශීය (රු.)		
8	Mastering the Government Payroll systems	2	2025/09/19	30,000.00		දේශීය	Payroll systems භාවිතය පිළිබඳ දැනුම
9	Employee soft skills development	3	2025/09/19	22,500.00		දේශීය	මෘදු කුසලතා වර්ධනය
10	දෙමළ භාෂා ප්‍රවීණතාවය	2	පැය 100	-		දේශීය	දෙමළ භාෂාව පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම
11	Anticoruption and Intergrity Training Conducted by ADB	4	දින 1	-		දේශීය	දූෂණ විරෝධී සහ අන්තර් ක්‍රියා පුහුණුව සම්බන්ධ දැනුම
12	Seminar on Blue Economy Think Tank Network for Indian Ocean Rim - China	1	2025/09/05 - 2025/09/25		116,281.00	විදේශීය	ඉන්දියානු සාගර කලාපය සඳහා නිල් ආර්ථික ජාල චින්තනය පිළිබඳ දැනුම
13	Seminar for senior Sri Lankan Government officials of Sri Lanka - China	3	2025/11/26 - 2025/12/09		354,817.98 (අනියම් දීමනාව) 30,829.5 (උණුසුම් ඇඳුම් දීමනාව)	විදේශීය	චීනයේ සංවර්ධන ප්‍රතිපත්ති, යහපාලනය, ප්‍රාදේශීය සංවර්ධනය සහ නාගරික සැලසුම්කරණය පිළිබඳ දැනුම
14	Regional Development and Economic activation	1	2025/04/16 - 2025/04/25	-	-	විදේශීය	කලාපීය සංවර්ධනය සහ ආර්ථික සක්‍රීයතාවය පිළිබඳ දැනුම

පරිච්ඡේදය - 07: අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් පැවරීම කිරීම (මූ.රෙ. 135)**			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල අධිකාරිය පවරාදී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2), DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන අපහරණය වී මාස 06 කට වඩා අඩු කාලයක දී බැහැර කර තිබීම	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අදාළ නොවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ.		
16.3	2017.09. 20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අදාළ නොවේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අදාළ නොවේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අදාළ නොවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අදාළ නොවේ		

අවසානය.